(ii) වර්ග කරන ලද අපද්‍රව්‍ය බක්කි හෝ බහාලු වල දමා ඉවත් කරනු ලබන තෙක් සුදුසු ස්ථානයක තබා ගතයුතුය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක පදිංචිකරුට, ඉහත (අ) සහ (ආ) යටතේ වර්ග කර ඇති අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) කාර්යාල සංකීර්ණයක හෝ සාප්පු සංකීර්ණයක හෝ සාප්පු සහ කාර්යාල විශාල සංඛ්‍යාවක් සහිත මහල් ගොඩනැගිල්ලක පිහිටි එක් එක් සාප්පුවේ හෝ කාර්යාලයේ එකතු කර වර්ග කරනු ලබන අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද සැලසුම් සහ පිරිවිතර වලට අනුකූල වන පරිදි අවශ්‍ය වන බක්කි සංඛ්‍යාවක් තැනවීම හෝ සුදුසු බහාලු සැපයීම ගොඩනැගිල්ලේ අයිතිකරුගේ යුතුකම වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන ඡේදයේ සඳහන් සෑම කාර්යාලයක හෝ සාප්පුවක පදිංචිකරු, වර්ග කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා වෙන්කර ඇති බක්කිවල හෝ බහාලුවල තැන්පත් කළ යුතුය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදයේ (අ) සහ (ආ) යටතේ දැක්වෙන වර්ග වල අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට භාරදීමට අයිතිකරුට බලය ඇත.

D.1-122

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදයේ (ඇ) යටතේ සඳහන් අපද්‍රව්‍ය හා (iii) වන හා (v) වන ඡේද යටතේ අවසර ලත් එකතු කරන්නෙකුට බාර නොදෙන ලද (අ) සහ (ආ) වර්ග වල අපද්‍රව්‍ය මහනගර සභාවේ එකතු කරන්නෙකුට බාර දියයුතු අතර, අපද්‍රව්‍ය බාර දීමට ප්‍රථම නියමිත ගාස්තුව, අවස්ථාවෝචිත පරිදි පදිංචිකරු හෝ අයිතිකරු විසින් නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අපද්‍රව්‍ය බක්කි හෝ බහාලු මනා තත්ත්වයෙන් නඩත්තු කිරීම හා සාප්පුවල හෝ කාර්යාල වල සේවය කරන තැනැත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ සනීපාරක්ෂාවට තර්ජනයක් නොවන ආකාරයට අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ක්‍රියාකිරීම අවස්ථාවෝචිත පරිදි පදිංචිකරුගේ හෝ අයිතිකරුගේ යුතුකම වන්නේය.

(viii) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් "කාර්යාලය" යන්නෙහි (129 වන අධිකාරිය වන) 1954 අංක 19 දරණ සාප්පු සහ කාර්යාල සේවක පනතේ දී ඇති අර්ථයම ඇත්තේය. "සාප්පුව" යන්නෙන් ඕනෑම ද්‍රව්‍යයක් තොග වශයෙන් හෝ සිල්ලරට විකුණනු ලබන ස්ථානයක් අදහස් කරනු ලබන අතර එයට ආහාර වර්ග හෝ පාන වර්ග විකුණනු ලබන ස්ථානයක්ද, කරණවෑමියකුගේ වෘත්තිය කරගෙන යනු ලබන ස්ථානයක් හා රූපලාවන්‍ය කටයුතු කරගෙන යනු ලබන ස්ථානයක්ද ඇතුළත් වේ.

"පදිංචිකරු" යන්නෙන් කිසියම් සාප්පු ව්‍යාපාරයක හෝ කාර්යාලයක අයිතිකරු වන තැනැත්තා හෝ පාලන බලය ගිම් තැනැත්තා අදහස් කරනු ලැබේ.

## හෝටල්

13. (i) සෑම හෝටල් ව්‍යාපාරයක අයිතිකරු, පරිශ්‍රයෙන් එකතු කරනු ලබන අපද්‍රව්‍ය පහත සඳහන් පරිදි වර්ග කළයුතුය.

(අ) ඉවත ලන ආහාර ද්‍රව්‍ය හා ජෛවභායනය වන අපද්‍රව්‍ය

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය



(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ii) වර්ග කරනු ලබන අපද්‍රව්‍ය බැහැර කරනු ලබන තෙක් සුදුසු භාජන වල හෝ බහාලු වල වෙන් වෙන්ව අසුරා සුදුසු ස්ථානයක ගබඩා කර තැබිය යුතුය.

(iii) ඉවත ලන ආහාර ද්‍රව්‍ය හා ජෛවභායනයවන අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ වලින් සාදන ලද අපාරගම්‍ය භාජනයක හෝ බහාලුවක අසුරා තැබිය යුතු අතර, මැස්සන්, කෘමීන්, මීයන් හෝ වෙනත් සතුන්ට ලඟා විය නොහැකි පරිදි හොඳින් වසා තැබිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් (අ) සහ (ඇ) වර්ගවල අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට බාරදිය හැකිය.

(v) (iv) වන ඡේදය යටතේ බාර නොදෙන ලද අපද්‍රව්‍ය හා (ඇ) වර්ගයේ අපද්‍රව්‍ය මහ නගර සභාවේ එකතු කරන්නෙකුට බාර දිය යුතු අතර බාර දීමට ප්‍රථම නියමිත ගාස්තුව, අයිතිකරු විසින් නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස " හෝටලය" යන්නෙන් මුදල් හෝ පරිදානයක් සඳහා නිදන පහසුකම සහිතව හෝ රහිතව ආහාර හෝ පාන වර්ග හෝ මත්පැන් එම පරිශ්‍රයෙහිදී පරිභෝජනය සඳහා පහසුකම සලසනු ලබන ස්ථානයක් අදහස් කරනු ලබන අතර, එයට ආපන ශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම් නිවාසයක්, තානායමක්, නේවාසිකාගාරයක්, බත් කඩයක්, භෝජනාගාරයක්, විශ්‍රාම ශාලාවක් හා හෝටලයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයකට සමාන ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන ඕනෑම පරිශ්‍රයක් ඇතුළත් වේ.

## එළවළු හෝ පළතුරු වෙළඳසැල්

14. (i) සෑම එළවළු හෝ පළතුරු විකිණීමේ ව්‍යාපාරයක අයිතිකරු, තම පරිශ්‍රයෙහි එකතු කරනු ලබන අපද්‍රව්‍ය පහත සඳහන් පරිදි වර්ග කළ යුතුය.

(අ) මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු එළවළු, පළතුරු හා වෙනත් අපද්‍රව්‍ය

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඈ) පරිශ්‍රය ඇමදීමෙන් එකතු කරනු ලබන දූවිලි හා වියළි අපද්‍රව්‍ය

(ii) ඉහත ඡේදයේ (අ) යටතේ වර්ග කරනු ලබන අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ වර්ගයකින් සාදන ලද අපාරගම්‍ය බඳුනක හෝ බඳුනුවල අසුරා තැබිය යුතු අතර බඳුන හෝ බඳුනු කෘමීන්, මීයන්, මැස්සන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන පරිදි වසා තැබිය යුතුය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු භාජනවල හෝ බඳුනුවල දැමිය යුතුය.

(iii) ඉහත (i) වන ඡේදයේ සඳහන් (අ), (ආ) සහ (ඈ) වර්ග වල අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට බාර දෙනු ලැබිය හැකිය. එසේ බාර නොදෙන ලද අපද්‍රව්‍ය හා (ඇ) වර්ගයේ අපද්‍රව්‍ය, නියමිත ගාස්තුව නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවීමෙන් පසු, මහනගර සභාවේ අපද්‍රව්‍ය එකතු කරන්නෙකුට බාර දියයුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "එළවළු හෝ පළතුරු වෙළඳසැල" යන්නෙන් විකිණීම සඳහා එළවළු හෝ පළතුරු තබා ගන්නා ස්ථානයක් අදහස් කරනු ලැබේ.

D.1-123

## මස්, මාළු හෝ බිත්තර වෙළඳ සැල්

15. (i) කිසිම තැනැත්තෙක්, ගෝ ඝාතන ආඥා පනතේ විධිවිධාන යටතේ ඝාතනය කළයුතු සතුන් හැර වෙනත් වර්ගයක සතෙකු, නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ මිස සහ බලපත්‍රයේ සඳහන් ස්ථානයේදී හැර ඝාතනය නොකළ යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක, ඝාතනය කළහැකි සත්ව වර්ගය හෝ වර්ග, ඝාතන ස්ථානය ඉදිකළ යුතු ආකාරය, ඝාතනය කරනු ලබන සතුන්ගේ ලේ සහ අනුනු බඩන් ඇතුළු මනුෂ්‍ය පරිභෝජනය සඳහා යොදා ගනු නොලබන කොටස් බැහැර කිරීම සහ පරිශ්‍රය පිරිසිදු කිරීම සම්බන්ධ



කොන්දේසි සහ නාගරික කොමසාරිස් වරයා සුදුසු යයි අදහස් කරනු ලබන වෙනත් කොන්දේසි ද ඇතුළත් කරනු ලැබිය යුතුය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා මහනගර සභාව මගින් ගාස්තුවක් පනවා අය කරනු ලැබිය හැකිය.

(iv) මස්, මාළු හෝ බිත්තර විකිණීමේ ව්‍යාපාරයක අයිතිකරු ස්වකීය පරිශ්‍රයෙහි එකතු කරනු ලබන අපද්‍රව්‍ය පහත සඳහන් පරිදි වර්ග කළ යුතුය.

(අ) මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු සත්ව සිරුරු, සිරුරු කොටස් හා බිත්තර

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඈ) පරිශ්‍රය ඇමදීමෙන් එකතු කරනු ලබන දූවිලි හා වෙනත් අපද්‍රව්‍ය

(v) වර්ග කරන ලද අපද්‍රව්‍ය වෙන් වෙන් භාජනවල ඇසිරිය යුතු අතර (අ) වර්ගයේ අපද්‍රව්‍ය අපාරගම්‍ය ද්‍රව්‍යයකින් සාදන ලද භාජන හෝ බඳුනු වල අසුරා තැබිය යුතු අතර මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුළු විය නොහැකි වන සේ සහ අවට වාතය සමඟ නොගැටෙන ලෙස මැනවින් වසා තැබිය යුතුය.

(vi) (iv) වන ඡේදයේ සඳහන් (අ), (ආ) සහ (ඈ) වර්ග වල අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට බාර දිය හැකිය. එසේ බාර නොදෙන ලද අපද්‍රව්‍ය සහ (ඇ) වර්ගයේ අපද්‍රව්‍ය දුර්ගන්ධය පැතිරීමට ප්‍රථම, නියමිත ගාස්තුව නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවීමෙන් පසු මහනගර සභාවේ අපද්‍රව්‍ය එකතු කරන්නෙකුට බාර දියයුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "මස්, මාළු හෝ බිත්තර වෙළඳ සැල" යන්නෙන් මස්, මාළු හෝ බිත්තර වෙළඳාම සඳහා තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයක් අදහස් කරනු ලැබේ.

## පදික වෙළඳාම

16. (i) අපද්‍රව්‍ය ජනනය වන සුළු ව්‍යාපාර කටයුතු කර ගෙන යන සෑම පදික වෙළෙන්දෙක්, නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිති සහ පිරිවිතර වලට අනුකූලව සාදන ලද බක්කි හෝ බඳුනු ප්‍රමාණවත් සංඛ්‍යාවක් අපද්‍රව්‍ය තැන්පත් කිරීම

සඳහා තබා ගතයුතු අතර, කිසිදු අපද්‍රව්‍යයක් පදික වේදිකාව මත හෝ මාර්ගය මත හෝ පොදු ස්ථානයක නොදැමිය යුතුය.

(ii) කිසිම පදික වෙළෙන්දෙක්, පදිකයින්ගේ හෝ වාහනවල හෝ ගමනාගමනයට බාධාවන පරිදි බක්කි හෝ බහාලුං තබා නොගත යුතුය.

(iii) සෑම පදික වෙළෙන්දෙකු තම ව්‍යාපාරික කටයුතු හේතුවෙන් හට ගනු ලබන අපද්‍රව්‍ය පහත සඳහන් පරිදි වර්ග කළ යුතුය.

(අ) ඉවත ලන ආහාර ද්‍රව්‍ය හා ජෛවහායනය වන අපද්‍රව්‍ය

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iv) වර්ග කරන ලද අපද්‍රව්‍ය, ඒ සඳහා වෙන්කර ඇති බක්කි හෝ බහාලුංවල තැන්පත් කිරීම හා ඕනෑම සතකු විසින් කෑමට ගනු ලැබිය හැකි (අ) වර්ගයේ අපද්‍රව්‍ය අඩංගු බහාලුං නිරන්තරයෙන් වසා තැබීම සෑම පදික වෙළෙන්දෙකුගේ යුතුකම වේ. බහාලුං, අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය අවස්ථා වලදී පමණක් විවෘත කරනු ලැබිය යුතුය.

(v) සෑම පදික වෙළෙන්දෙන් තමා විසින් එකතු කරනු ලබන (අ) සහ (ආ) වර්ග වල අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට හෝ (ඇ) වර්ගයේ අපද්‍රව්‍ය සමග මහනගර සභාවේ අපද්‍රව්‍ය එකතු කරන්නෙකුට දිනපතා බාර දියයුතුය. ඔහු ව්‍යාපාරික කටයුතු වල නොයෙදෙන අවස්ථා වලදී අපද්‍රව්‍ය සහිත බහාලුං, පදික වේදිකාව, මාර්ගය හෝ මහා මාර්ගය මත නොතැබිය යුතුය.

(vi) මහ නගර සභාවේ එකතු කරන්නෙකුට අපද්‍රව්‍ය භාරදීමට ප්‍රථම නියමිත ගාස්තුව, නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යන් සඳහා, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "පදික වෙළෙන්දන්" යන්නෙන් පදික වේදිකාව මත හෝ මාර්ගය මත සිට භාණ්ඩ වෙළඳාම කරන තැනැත්තෙකු හෝ සේවා සැපයීම කරන තැනැත්තකු අදහස් කරනු ලැබේ.





## කර්මාන්ත ශාලා

17\. (i) සෑම කර්මාන්ත ශාලාවකම නිෂ්පාදන ව්‍යාපාරයේ අයිතිකරු , කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනිත වන අපද්‍රව්‍ය එකතු කරනු ලැබිය යුතු අතර, එවා පහත සඳහන් පරිදි වර්ග කළ යුතුය.

(අ) ජෛවහායනයවන අපද්‍රව්‍ය හා කාබනික අපද්‍රව්‍ය

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීයකරණය කළහැකි අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ii) (අ) සහ (ආ) යටතේ දැක්වෙන අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට බාරදිය හැකි අතර එසේ බාර නොදෙන ලද අපද්‍රව්‍ය නියමිත ගාස්තුව නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවීමෙන් පසු මහ නගර සභාවේ එකතු කරන්නෙකුට බාරදියයුතු වේ.

(iii) උපද්‍රවකාරී අපද්‍රව්‍ය 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව බැහැර කරනු ලැබිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "කර්මාන්ත ශාලාව" යන්නෙහි (128 වන අධිකාරිය වන) 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතෙහි දී ඇති අර්ථයම ඇත්තේය.

## කැනීම්, ඉදිකිරීම් හා බිඳ හෙලීම්

18\. (i) ඉදිකිරීමෙ, කැනීමෙ හෝ බිඳ හෙළීමෙ ක්‍රියාකාරකමක නිරත වන සෑම තැනැත්තෙක්, එම ක්‍රියාකාරකම හේතුවෙන් හට ගන්නා අපද්‍රව්‍ය, සුදුසු ආකාරයකට බැහැර කරනු ලබන තෙක්, එම ක්‍රියාකාරකම කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි හෝ නාගරික කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද වෙනත් පරිශ්‍රයක ගබඩා කර තබා ගතයුතුය.

(ii) යථෝක්ත අපද්‍රව්‍ය, නියමිත ගාස්තුව නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවීමෙන් අනතුරුව, මහ නගර සභාවේ එකතු කරන්නෙකුට බාර දියයුතුය.

(iii) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් "අපද්‍රව්‍ය" යන්නට කිසියම් ඉදිකිරීමක් සඳහා පොළොව කැනීමෙන් හට ගන්නා පස්, මඩ හා දූවිලි ද , ගොඩනැගිලි ද්‍රව්‍ය යොදා ගැනීමෙන් කරනු ලබන ඉදිකිරීමේ ක්‍රියාකාරකමකින් හෝ කිසියම් ඉදි කිරීමක් බිඳ හෙලීමේදී හටගන්නා අපද්‍රව්‍ය ද ඇතුළත් වේ.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් "ඉදිකිරීම හෝ බිඳ හෙළීමේ ක්‍රියාකාරකමක නිරතවන සෑම තැනැත්තෙක්" යන්නට කිසියම් සේවා යෝජකයෙකු යටතේ සේවයේ යොදවනු ලැබ ඇති තැනැත්තකු ඇතුළත් නොවේ.

19. (i) යම් තැනැත්තකු ගෑස්, විදුලිබලය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු සේවාවක් සැපයීමට හෝ පෞද්ගලික කාර්යයක් සඳහා මහනගරයේ වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක කැනීම් කටයුතු කිරීමට පෙර, ඒ සඳහා නාගරික කොමසාරිස් වරයාගේ අනුමැතිය ලබා ගතයුතුය.

D.1-125

(ii) පූර්වගාමී ඡේදයේ විධිවිධාන යටතේ අනුමැතිය ලබා දීමට පෙර, යෝජිත කාර්යය අවසන් කිරීමෙන් පසු මාර්ගය හෝ පොදු ස්ථාන මත ඉතිරි වියහැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ අපද්‍රව්‍ය ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා සිටින තැනැත්තා යොදා ඇති විධිවිධාන පිළිබඳව නාගරික කොමසාරිස් වරයා සලකා බැලිය යුතු අතර, අපද්‍රව්‍ය ඉවත් කිරීම එකී තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත් එවා ඉවත් කිරීම සඳහා මහනගර සභාවට දැරීමට සිදුවෙතැයි ආගණනය කරනු ලබන වියදමට සමාන මුදලක් තැන්පතුවක් ලෙස පෙර කී තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතුය.

(iii) තම කාර්යය නිම කිරීමෙන් පසු යම් තැනැත්තකු සම්පූර්ණ අපද්‍රව්‍ය ප්‍රමාණය හෝ එයින් කොටසක් ඉවත් කිරීම පැහැර හරින ලද්දේ නම්, සුදුසු යයි නාගරික කොමසාරිස් වරයා තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ඉවත් කර, එම කාර්යය සඳහා වැය කරන ලද මුදල තැන්පත් මුදලෙන් ගිලවී කර ගත යුතුය.



## රෝහල්

20. (i) සෑම රෝහල් ව්‍යාපාරයක අයිතිකරු, ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී ජනිතවන අපද්‍රව්‍ය පහත සඳහන් පරිදි වර්ග කළ යුතුය.

(අ) ඉවත ලන ආහාර ද්‍රව්‍ය හා ජෛවහායනය වන අපද්‍රව්‍ය

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රියකරණය කළහැකි අපද්‍රව්‍ය

(ඇ) (ආ) වර්ගයේ අපද්‍රව්‍ය හැර උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඈ) උපද්‍රවකාරී සෞඛ්‍යාරක්ෂන අපද්‍රව්‍ය

(ii) (අ) සහ (ආ) වර්ගවල අපද්‍රව්‍ය වෙන් වෙන් බහාලු වල අසුරා බැහැර කරනු ලබන තෙක් සුදුසු ස්ථානයක ගබඩා කර තැබිය යුතුය. (ඇ) සහ (ඈ) වර්ගවල අපද්‍රව්‍ය ඒ සඳහා විශේෂයෙන් සාදන ලද බහාලු හෝ භාජන වල අසුරා වෙන් කරන ලද ස්ථානයක ගබඩා කර තැබිය යුතු අතර 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව බැහැර කළ යුතුය.

(iii) (අ) සහ (ආ) වර්ගවල අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට හෝ නියමිත ගාස්තුව නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවා මහ නගර සභාවේ එකතු කරන්නෙකුට බාරදිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "රෝහල" යන්නෙන් රෝගී වූ හෝ තුවාල ලැබූ මිනිසුන් හෝ සතුන් පරීක්ෂා කිරීම, රෝග විනිශ්චය කිරීම හා ප්‍රතිකාර කිරීම කරනු ලබන්නාවූද, ප්‍රතිකාර කරනු ලබන කාලය තුලදී නැවතී සිටීමේ පහසුකම් සලසනු ලබන්නාවූද, ස්ථානයක් අදහස් කරනු ලබන අතර, එයට සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, ව්‍යාධිවේදීය රසායනාගාරයක්, මාතෘ නිවාසයක් , පශු වෛද්‍ය ගිලන්හලක් හා රෝහලක ඉටු කරනු ලබන කාර්යයන්ට සමාන කාර්යයන් ඉටු කරනු ලබන ඕනෑම ස්ථානයක් ඇතුළත් වේ.

"උපද්‍රවකාරී සෞඛ්‍යාරක්ෂන අපද්‍රව්‍ය " යන්නට සායනික අපද්‍රව්‍ය, ශාරීරික කොටස්, වැදෑමහ, ආසාදක සහ වන ආසාදක අපද්‍රව්‍ය සහ තියුණු දෑ ඇතුලත් වේ.

## වෙනත් පරිශ්‍ර

21. (i) (9) සිට (20) දක්වා වූ අතුරු ව්‍යවස්ථා වල සඳහන් කර නොමැති කිසියම් වෙනත් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙක් හෝ මහජන සහභාගීත්වය සහිතව ආගමික, සාමාජික , සංස්කෘතික හෝ අධ්‍යාපනික කාර්යයන් සංවිධානය කරන තැනැත්තෙක් , ව්‍යාපාරය හෝ කාර්යයන් හේතුවෙන් තම පරිශ්‍රය තුල ජනිත වන අපද්‍රව්‍ය පහත සඳහන් පරිදි වර්ග කළ යුතුය.

(අ) ඉවත ලද ආහාර ද්‍රව්‍ය හා ජෛවහායනයවන අපද්‍රව්‍ය

(ආ) නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය හා ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ii) පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් සහභාගි වන ක්‍රියාකාරකමක් සංවිධානය කරන යම් තැනැත්තෙක් හෝ තැනැත්තන්, එම ක්‍රියාකාරකම හේතුවෙන් ජනිත වන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස, යථෝක්ත ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පූර්වයෙන් ඒ බව සභාවට දැන්විය යුතුය. එවැනි පරිවේෂණ වලදී අපද්‍රව්‍ය එකතු කිරීම, නාගරික කොමසාරිස් වරයා විසින් කරනු ලබන තීරණයන්ට අනුව වූ ගාස්තුවකට යටත් වියයුතුය.

(iii) වර්ග කරන ලද අපද්‍රව්‍ය බැහැර කරනු ලබන තෙක් වෙන් වෙන්ව බහාලූ වල ඇසිරිය යුතු අතර, ඒවා සුදුසු ස්ථානයක ගබඩා කර තැබිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදයේ (අ) සහ (ආ) යටතේ සඳහන් අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට භාර දියහැකි අතර, එසේ භාර නොදෙන ලද්දේ නම් (ඇ) වර්ගයේ අපද්‍රව්‍ය සමඟ මහනගර සභාවේ එකතු කරන්නෙකුට බාරදිය යුතු අතර, අපද්‍රව්‍ය බාරදීමට ප්‍රථම, නියමිත ගාස්තුව නාගරික කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.



## වීථි හා පොදු ස්ථාන

22. (i) මහ නගර සභාවේ තීරණ වලට හා යෝජනා සම්මුති වලට අනුකූලව හා නගරාධිපති වරයාගේ පාලනයට යටත්ව පහත සඳහන් කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම නාගරික කොමසාරිස් වරයාගේ යුතුකම වන්නේය.

(අ) මහනගර සභා ප්‍රදේශය තුල පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපලවල් ඇමදීමෙන් හෝ වෙනත් ආකාරයකින් සියළු වේලාවන්හිදී පිරිසිදු කිරීම හා පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයකින් පවත්වා ගැනීම;

(ආ) සියළු පොදු ස්ථාන වල හා මාර්ග හා වීථි දෙපස ප්‍රමාණවත් අපද්‍රව්‍ය භාජන සංඛ්‍යාවක් සැපයීම හෝ සවි කිරීම හා ඒවා මැනවින් නඩත්තු කිරීම ;

(ඇ) සභාව එසේ කිරීමට තීරණය කරන්නේ නම් හෝ සංවිධායකයින්ගේ ඉල්ලීමක් අනුව, ප්‍රසිද්ධ ස්ථාන වලට, උත්සව අවස්ථා වලදී හෝ විශේෂ අවස්ථා වලදී එවල අපද්‍රව්‍ය පෙට්ටි හෝ බක්කි සැපයීම;

(ඈ) නේවාසික ප්‍රදේශ තුල ස්ථාපනය කර ඇති පොදු කසල බක්කි හෝ බහාලූ සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කිරීම සහ ඒවාගේ තැන්පත් කර ඇති අපද්‍රව්‍ය, ඒ අවට පදිංචිකරුවන්ට පීඩාවක් සිදු වීමට පෙර ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී (අ) සිට (ඈ) දක්වා වූ ඡේද වල සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නගරාධිපතිවරයා හෝ කොමසාරිස් වරයා වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම හා ඒවා සම්බන්ධයෙන් වහාම ක්‍රියා කිරීම.

(ii) කිසිම තැනැත්තෙක් විසින් විශේෂයෙන් කුණු රොඩු දැමීම සඳහා සපයා ඇති භාජන වලට ගෘහස්ථ, වාණිජ, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය දැමීම නොකළයුතුය.

D.1-127

## නාගරික කොමසාරිස්ගේ කර්තව්‍යයන්

23. (i) මහානගර සභාවේ අනුමැතියට අනුකූලව සහ නගරාධිපති වරයාගේ පාලනයට යටත්ව පහත සඳහන් කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම නාගරික කොමසාරිස් වරයාගේ කර්තව්‍යය වන්නේය.

(අ) අපද්‍රව්‍ය අවම කිරීම, නැවත පාවිච්චි කිරීමට හා ප්‍රතිචක්‍රීකරණයට මහජනයා දිරිගැන්වීම.

(ආ) අපද්‍රව්‍ය එකතු කිරීම, වර්ග කිරීම, ගබඩා කිරීම, බැහැර කිරීම හා අපහරණය කිරීමේදී ඔවුන් විසින් කළයුතු කාර්යයන් සම්බන්ධයෙන් සුදුසු මාධ්‍ය මගින් මහජනතාව දැනුවත් කිරීම.

(ඇ) ගබඩා හෝ වැඩ කරන ස්ථාන, උපකරණ, ආයුධ, බඳු සහන ආදිය සැපයීමෙන් අපද්‍රව්‍ය නැවත පාවිච්චියට පිළියෙල කිරීමේ හෝ ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ක්‍රියාකාරකම් වල යෙදී සිටින කුඩා ව්‍යාපාර සහ පෞද්ගලික තැනැත්තන්ට සහාය වීම.

(ඈ) අපද්‍රව්‍ය බැහැර කිරීමේ විවිධ ක්‍රම විධිමත් කිරීම.

(ඉ) මහා නාගරිකයේ විවිධ ප්‍රදේශ තුල විවිධ වර්ග වල අපද්‍රව්‍ය එකතු කිරීමේ දින, කාලවේලාවන්, එකතු කරන ක්‍රම සහ ගාස්තු ආදිය දැක්වෙන උපලේඛනයක් පිළියෙල කිරීම. මෙම උපලේඛනය ප්‍රසිද්ධියේ නිවේදනය කළයුතු අතර, රජයේ නිවාඩු දින වලදී අපද්‍රව්‍ය එකතු කිරීමේ කොන්දේසි ද එයට ඇතුළත් කළහැකිය.

(ඊ) අවසර ලත් එකතු කරන්නන්ට බාර නොදෙන ලද අපද්‍රව්‍ය, එෆ් වෙන්ව උපලේඛනයේ දැක්වෙන වේලාවන්හිදී එකතු කිරීම.

(උ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය සහ අවසර ලත් එකතු කරන්නන්ට බාර නොදෙන ලද වෙනත් යම් අපද්‍රව්‍ය, සනීපාරක්ෂක ආකාරයට ප්‍රවාහනය කිරීම.

(ඌ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා නාගරික කොමසාරිස් වරයා විසින් නියමය කරන ලද වෙනත් වර්ග වල අපද්‍රව්‍ය හැර, වීථි ඇමදීමෙන්, කාණු හා පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු බක්කි වලින් එකතු කරනු ලබන අපද්‍රව්‍ය අවසර ලත් එකතු කරන්නෙකුට හෝ එකතු කරන්නන්ට බාර දීම.

(එ) ක්‍රියාත්මක කළහැකි ප්‍රමාණයකට, ආහාර ද්‍රව්‍ය හා සෞඛ්‍යායතනය වන අපද්‍රව්‍ය, නැවත පාවිච්චි කළහැකි හා ප්‍රතිචක්‍රීයකරණය කළහැකි අපද්‍රව්‍ය සියල්ල හෝ ඉන් කොටසක් සැකසීම හා පිරියම් කිරීම ඇතුළුව, නාගරික අපද්‍රව්‍ය එකතු කරන්නන් විසින් එකතු කරන ලද, වර්ගීකෘත අපද්‍රව්‍ය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ යථෝක්ත මෙහෙයුම් කටයුතු වලදී ඉවත දමන ලද අපද්‍රව්‍ය සහ වෙනත් වර්ග වල ශේෂ වූ අපද්‍රව්‍ය, නාගරික කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද ආකාරයකට අපහරණය කිරීම.

(ඒ) මධ්‍යම පරිසර අධිකාරිය සහ නාගරික කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද යෝග්‍ය ආකාරයකට උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය සියල්ල අපහරණය කිරීම.

(ඓ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍රය හෝ බලපත්‍රයක් ලබා ගැනීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂණ ඉඩම් පිරවීම සඳහා යෙදවීම.

(ඔ) අපද්‍රව්‍ය ඇමදීම, එකතු කිරීම, ප්‍රවාහනය, මාරු කිරීම හා අපහරණය කිරීම යන කාර්යයන්හි යොදවනු ලබන සෑම සේවකයෙකුටම යෝග්‍ය ඇඳුම්, අත්වැසුම්, මුව ආවරණ හා බූට්ස් සැපයීම.

(ඕ) නිවාස හෝ වෙනත් පරිශ්‍ර ඉදිකිරීම හෝ නවීකරණය සඳහා ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලද ප්‍රණිධි වලදී, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම හා වැඩ සම්පූර්ණ කිරීම යන ද්විත්ව පියවරවලදීම, පරිශ්‍රයෙන් ජනිත වන සියළු අපද්‍රව්‍ය ගබඩා කිරීම, සැකසීම (උදා. කොම්පෝස්ට් තැනීම) හා අපහරණය (වල දැමීම, පිළිස්සීම, බැහැර කිරීම) කරන ආකාරය පිළිබඳ විස්තර සහ ඉල්ලුම් පත්‍රයෙහි නිරූපිත කාර්යයන් ඉටු කර තිබේද යන්න පරීක්ෂා කිරීම සහ අනුමත කිරීම.

(ඖ) නගර සභාවේ සියළු පරිශ්‍ර සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම.

(ක) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ග වලට (2000) සහ අදාල වෙනත් ව්‍යවස්ථා වලට අනුකූල වන පරිදි ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම. මෙම සැලසුමට ඉදිරි ගෙවසරෙහි එක් එක් ලින් වර්ෂය තුලදී ඉටු කරනු ලබන කාර්යයන් සවිස්තරව අඩංගු වියයුතුය. එසේම පිළියෙල කර ඇති කාලච්ඡේද අනුව වාර්ෂිකව හෝ ඊට අඩු කාලාන්තර වලදී එකී සැලසුම සභාව මඟින් අනුමත කරනු ලැබීම අවශ්‍ය වේ.

(ඛ) (අ) සිට (ක) දක්වා විෂයයන්හි ඇතුලත් පූර්වගාමී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නගරාධිපති හෝ නාගරික කොමසාරිස් වෙත යොමු කරන ලද සෑම පැමිණිල්ලක්ම විමර්ශනය කර නොපමාව සුදුසු පියවර ගැනීම.

## අවසර පත්‍ර

D.1-128

24. (i) ප්‍රතිචක්‍රීකරණය, කොම්පෝස්ට් පොහොර නිපදවීම, ජීව වායු නිපදවීම නැවත පාවිච්චිය සඳහා සැකසීම හෝ මහනගර සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා, අපද්‍රව්‍ය එකතු කිරීමට අවසර පත්‍රයක් ඉල්ලුම්කරනු ලබන කිසියම් තැනැත්තකුට පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරන්නේ නම් අවසර පත්‍රයක් නිකුත් කිරීමට නාගරික කොමසාරිස් වරයාට බලය ඇත්තේය.

(අ) අවසර පත්‍රය ඉල්ලුම් කරන තැනැත්තා අදාළ ව්‍යාපාරය මහ නගර සභා බල ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන්නේ නම් , නාගරික කොමසාරිස් වරයා වෙතින් හෝ වෙනත් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක පවත්වා ගෙන යනු ලබන්නේ නම් එම ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ නිසි බලධරයාගෙන් අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ තත් කාර්යය කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

(ආ) 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

(ඇ) එකතු කරනු ලබන අපද්‍රව්‍ය මහ නගර සභා බල ප්‍රදේශයේ ගබඩා කරන්නේ නම්



නාගරික කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා පිරිවිතර වලට අනුකූලව තනවන ලද ප්‍රමාණවත් ගබඩාවක් හෝ ගබඩා තිබිය යුතුය.

(ඈ) සෞඛ්‍යාරක්ෂක ලෙස හා මහජනයාට පීඩාවක් නොවන ලෙස අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට සුදුසු වාහනයක් හෝ වාහන තිබිය යුතුය.

(ඉ) ව්‍යාපාරය මහනගර සභා බල ප්‍රදේශය තුළ කරගෙන යනු ලබන්නේ නම්, ශේෂ වන හෝ ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය හා කර්මාන්තයේ අතුරු නිෂ්පාදන ලෙස හට ගන්නා අපද්‍රව්‍ය මහ නගර සභාවට භාර දීමටත් ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවීමටත් එකඟතාවය පළ කළයුතුය.

(ii) නාගරික කොමසාරිස්වරයා, ඉල්ලුම්පත්‍රය භාර ගෙන දින තිහක් ගතවීමට ප්‍රථම අවසර පත්‍රය නිකුත් කිරීම හෝ අවසර පත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු වූ කරුණු ඉල්ලුම්කරුට ලිඛිතව දැන්වීම හෝ කළයුතුය.

(iii) අවසර පත්‍රයේ වලංගු කාලය, එකතු කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග, අපද්‍රව්‍ය එකතු කිරීමට බලය පවරනු ලබන ප්‍රදේශය හා සුදුසු යයි අදහස් කරන වෙනත් කොන්දේසියක් හෝ කොන්දේසි නාගරික කොමසාරිස් වරයා අවසර පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදයේ විධිවිධාන වලට අනුකූල නොවීම, එහි සඳහන් කිසියම් බලපත්‍රයක් ලබා නොතිබීම, ලබාගෙන තිබූ බලපත්‍රයක් අවලංගු කර තිබීම හෝ , අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි හෝ කොන්දේසි කඩ කර තිබීම මත නිකුත් කර ඇති අවසර පත්‍රය අවලංගු කිරීමට නාගරික කොමසාරිස් වරයාට බලය ඇත්තේය.

(v) ඉහත ඡේදයේ විධිවිධාන අනුව අවසර පත්‍රයක් අවලංගු කළ විට කිසිම තැනැත්තකු විසින් අපද්‍රව්‍ය භාර ගැනීම නොකළ යුතුය. තවද අවසර පත්‍රයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් සුදුසු මාධ්‍යයකින් මහජනතාව දැනුවත් කිරීම නාගරික කොමසාරිස් වරයාගේ යුතුකම විය යුතුය.

## අපද්‍රව්‍ය අපහරණ බිම් ප්‍රදේශ

25. යම් තැනැත්තෙක්, සභාව මගින් අවසර දී තිබෙන මිස හා අවසර පත්‍රයෙහි නිරූපිත කොන්දේසි යටතේ හැර, සභාව මගින් අපද්‍රව්‍ය අපහරණ බිම් ප්‍රදේශයක් ලෙස අවශේෂිත ප්‍රදේශයකට ඇතුළු වීම හෝ එහි නිකරුණේ ගැවසීම හෝ යම් ද්‍රව්‍යයන් හෝ දේවල් එම බිම් ප්‍රදේශයේ තැන්පත් කිරීම හෝ එම ප්‍රදේශයෙන් ඉවත් කිරීම හෝ තැන්පත් නොකළ යුතු ලෙසට සභාව මගින් කලින් කලට සම්ප්‍රතිපාදනය කරන ද්‍රව්‍යයන් තැන්පත් කිරීම නොකළ යුතුය.

26. මහනගර සභාව සහ මධ්‍යම පරිසර අධිකාරිය මගින් දෙන ලද ලිඛිත අනුමැතියක් නොමැතිව සහ එම අනුමැතියට අදාල කොන්දේසි වලට අනුකූලව හැර, කිසිම තැනැත්තෙක් මහනගර සභා ප්‍රදේශය තුල පිහිටි ඉඩමක් හෝ පහසුකම සැලසීමක්, එම ඉඩමින් හෝ පහසුකම සැලසීමකින් බැහැරව ජනනය වන අපද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා සැපයීම, යෙදවීම හෝ භාවිතා කිරීම නොකළ යුතුය.

## <u>වෙනත්</u>

D.1-129

27. (i) නාගරික කොමසාරිස් වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකුට සියළු සාධාරණ වේලාවන්හිදී ඕනෑම පරිශ්‍රයකට ඇතුළු වීමට හා මෙම අතුරු ව්‍යවස්ථා වල විධිවිධාන වලට අනුකූලව පදිංචිකරු හෝ අයිතිකරු ක්‍රියා කරනු ලබන්නේද යන්න පරීක්ෂා කිරීමට බලය ඇත්තේය.

(ii) පරීක්ෂණය සඳහා කිසියම් පරිශ්‍රයකට පැමිණි නාගරික කොමසාරිස් වරයාට හෝ බලයලත් නිලධාරියාට අවශ්‍ය විය හැකි සියළු තොරතුරු සැපයීම හා පරීක්ෂණයට සහාය වීම එම පරිශ්‍රයේ අයිතිකරුගේ, පදිංචිකරුගේ, බාරකරුගේ හෝ කළමනාකරුගේ සහ එකී පරිශ්‍රයෙහි වාසය කරන හෝ සේවය කරන සියළු තැනැත්තන්ගේ යුතුකම වන්නේය.

(iii) පරීක්ෂණය සඳහා පැමිණි නාගරික කොමසාරිස් වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ හෝ සහායක නිලධාරියාගේ රාජකාරී කටයුතු වලට කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුතුය.



(iv) කිසියම් තැනැත්තෙක් (7) වන අතුරු ව්‍යවස්ථාවේ (i), (ii) හෝ (iii) වන ඡේදයේ විධිවිධාන වලට පටහැනිව ක්‍රියා කිරීම වරදක් වන අතර වරද සිදු කරන අවස්ථාවේදී හෝ වරද සිදුකර සාධාරණ කාලයක් ඇතුළත වරදකරුගෙන් රුපියල් 250/- ක උපරිමයක් නොඉක්මවන දණ්ඩනයක් අයකර ගැනීමට යම් පොලිස් නිලධාරියෙකුට හෝ නාගරික කොමසාරිස් විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට බලය ඇත. අයකර ගනු ලබන දඩ මුදල් නොපමාව නාගරික කොමසාරිස් වරයා වෙත බාරදීම දඩ මුදල් අය කළ පොලිස් නිලධාරියාගේ හෝ බලයලත් නිලධාරියාගේ යුතුකම වන්නේය.

28. මෙම අතුරු ව්‍යවස්ථා වල යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, යම් තැනැත්තෙක් නිසි අධිකරණයක් මගින් වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් දහසක් නොඉක්මවන දඩයකටද, දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකටද, නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වනවිට වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරවමින් නගරාධිපති වරයා විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහා රුපියල් 250/- නොඉක්මවන දඩයකට ද යටත් විය යුතුය.

## අර්ථ නිරූපනය

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථා වල,

"අපද්‍රව්‍ය" යන්නෙන් ඝණ අපද්‍රව්‍ය අදහස් කරනු ලබන අතර, ඒවා අත්හරින පුද්ගලයාට කිසිදු පාරිභෝගික වටිනාකමක් නොමැති ද්‍රව්‍යයන්ද, කසල, කුණු කසල , කුණුරොඩු , දූවිලි, මඩ, අළු, වීදී ඇමදීමෙන් එකතු කරනු ලබන ද්‍රව්‍යයන් හා කාණු පිරිසිදු කිරීමෙන් එකතු කරනු ලබන ද්‍රව්‍යයන් ද ඇතුලත් වේ.

"අපහරණය" යන්නෙන් නැවත පාවිච්චි නොකරන ලද, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද, සකස් නොකරන ලද හෝ පිරියම් නොකරන ලද, සකස් නොකරන ලද හෝ පිරියම් නොකරන

D.1-130

ලද සියළු අපද්‍රව්‍ය ස්ථාවරව රඳවා තැබීම සඳහා භූමිය මත හෝ තුළ තැන්පත් කිරීම අදහස් කරනු ලැබේ.

"අයිතිකරු" යන්නට යම් තැනැත්තෙකුගේ ව්‍යාපාරය, කර්මාන්තය හෝ දේපල කළමනාකරණය සඳහා පත් කරනු ලැබ ඇති ඇටෝර්නි බලකරුවකු අනුයෝජිතයකු, භාරකරුවකු ද, බදු ලැබුම්කරුවකු ද ඇතුළත් වන නමුත් යම්කිසි තැනැත්තෙකුගේ විධානය යටතේ ක්‍රියා කරන කළමනාකරුවකු ඇතුළත් නොවේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් ආහාරයට ගැනීමට නුසුදුසු මස්, මාළු, බිත්තර, එළවළු, පළතුරු හා වෙනත් ද්‍රව්‍ය අදහස් කරනු ලැබේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් විෂ සහිත, විඛාදක, ගිනි ගන්නා සුළු, ප්‍රතික්‍රියාකාරක, විකිරණශීලී හෝ ආසාදන ස්වභාවයක් සහිත අපද්‍රව්‍ය අදහස් වේ.

"එකතු කිරීම" යන්නෙන් නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ අපහරණය සඳහා මහනගර සභාවේ එකතු කරන්නෙකු හෝ අවසර ලත් එකතු කරන්නෙකු විසින් පරිශ්‍ර වලින් හෝ පුද්ගලයින් විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය භාර ගැනීම අදහස් කරනු ලැබේ.

"කුණු රොඩු" යන්නට මහජනයා විසින් ඉවත දමනු ලබන ලොතරැයි ටිකට් පත්, කඩදාසි සහ පොලිතින් මලු, සිගරට් පෙට්ටි, ආහාර ශේෂ ද්‍රව්‍ය, පළතුරු වල පොතු හා ලෙලි, සිගරට් කොට ආදිය කුඩා ද්‍රව්‍ය ඇතුළත් වේ.

"කොමසාරිස්" යන්නෙන් . . . . . . . . . . . මහනගර සභාවේ නාගරික කොමසාරිස් වරයා හෝ නාගරික කොමසාරිස් වරයාට පැවරී ඇති කර්තව්‍ය හා කාර්යයන් ඉටු කිරීම සඳහා බලය පවරනු ලැබ ඇති වෙනත් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.



"කොම්පෝස්ට්කරණය" යන්නෙන් වාතය පවත්නා විටදී ක්ෂුද්‍ර ජීවීන් විසින් ආහාර සහ ජෛවහායනය වන අපද්‍රව්‍ය බිඳ හෙලීම අදහස් කරනු ලැබේ.

"ගබඩා කිරීම" යන්නෙන් පදිංචිකරු හෝ අයිතිකරු, බැහැර කරනු ලබන ඝන අපද්‍රව්‍ය තම පරිශ්‍රය තුළ තබා ගැනීම හෝ අනුමත පොදු එකතු කරන ස්ථානයක දැමීම අදහස් කරනු ලැබේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නට කිසියම් ගෙවත්තක පිහිටි ගස් වලින් ඉවත් කරනු ලබන හෝ වෙන් වූ කොටස් ද ගෙවත්තෙන් ඉවත් කරනු ලබන ගල්, පස් ආදී අපද්‍රව්‍යයන් ද ඇතුලත් වේ.
"ජෛවහායනය වන අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් වියෝජනය වීම හෝ බිඳී යාම නිසා හායනය වන අපද්‍රව්‍ය අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාපන කරන ලද හෝ නොකරන ලද යම් සමාගමක්, සංගමයක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුලත් වේ.

"නැවත පාවිච්චි කළහැකි අපද්‍රව්‍ය" යන්නෙන් සේදීමෙන් හෝ නිර්ආසාදනය කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් පිරිසිදු කිරීමෙන් නැවත පාවිච්චි කළහැකි වන අපද්‍රව්‍ය අදහස් කරනු ලැබේ.

"නියමිත ගාස්තුව" යන්නෙන් මහනගර සභාව විසින් නියම කරන ලද ගාස්තුව අදහස් කරනු ලැබේ.

"පිරියම් කිරීම" යන්නෙන් අපද්‍රව්‍ය මගින් මහජනයාට හෝ පරිසරයට සිදු වියහැකි විපත හිංසා හෝ හානි අවම කිරීම සඳහා (උදා. උදාසීනකරණය, ජීවාණුහරණය, කොම්පෝස්ට් තැනීම, භස්මීකරණය ආදිය) යම් පියවර ගැනීම හෝ ඒවා සැකසීම අදහස් කරනු ලැබේ.

"පොදු ස්ථානයක් " යන්නෙන් නෛතික හිමිකමක් නොමැති වුවද මහජනයාට කිසිවකුගේ හෝ බාධාවකින් තොරව ප්‍රවේශ වීමට හා ගැසිරීමට අයිතිවාසිකමක් පැවරී ඇති ස්ථානයක් අදහස් කරනු ලැබේ.

"පොලිස් නිලධාරියා" යන්නෙන් ප්‍රතිෂ්ඨාපිත පොලිස් බලකායක සාමාජිකයෙකු අදහස් කරනු ලබන අතර, එයට පොලිස් උප සේවකයෝ ද ඇතුළත් වෙති.

"පෞද්ගලික පරිශ්‍රය" යන්නෙන් යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින් කණ්ඩායමකට අයත් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගනු ලබන ස්ථානයක් අදහස් කරනු ලැබේ.

"ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය" යන්නෙන් ඒවායේ මුල් ස්වභාවය තවදුරටත් හඳුනාගත නොහැකි ආකාරයේ නව භාණ්ඩ නිපදවීම සඳහා යොදා ගතහැකි අපද්‍රව්‍ය අදහස් කරනු ලැබේ. එයට එහි ඇතුලත් අමල ඉවත් කිරීමෙන් ඊයම් ලබා ගැනීම සඳහා ප්‍රතිචක්‍රීකරණය කළහැකි ලෙඩ - ඇසිඩ් බැටරි ද ඇතුළත් වේ.

"ප්‍රවාහනය" යන්නෙන් අපද්‍රව්‍ය, එකතු කරන ස්ථානයක සිට සකසන, පිරියම් කරන හෝ අපහරණ පහසුකම් සලසන ස්ථානයක් දක්වා, මිනිස්, සත්ව හෝ යාන්ත්‍රික ජවයෙන් ක්‍රියා කරන වාහනයකින් රැගෙන යාම අදහස් කරනු ලැබේ.

"බක්කිය හෝ වෙනත් බහාලුම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා වල විධිවිධානයන්ට ගැලපෙන ලෙස පිළියෙල කරන ලද, අපද්‍රව්‍ය ගබඩා කිරීම, බැහැර කිරීම, එකතු කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන පෙට්ටි, මලු, ගෝනි, භාජන හෝ වෙනත් ආකාරයක භාජන අදහස් කරනු ලැබේ.





"බලයලත් නිලධාරියා" යන්නෙන් කිසියම් කාර්යයක් ඉටු කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා යටතේ . . . . . . . . . . මහනගර සභාවේ නාගරික කොමසාරිස් වරයා විසින් බලය පවරන ලද කිසියම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"බැහැර කිරීම" යන්නෙන් පරිශ්‍රයක ජනිත වන අපද්‍රව්‍ය සියල්ල හෝ කොටසක් අවසර ලත් එකතු කරන්නෙකුට හෝ සභාවේ එකතු කරන්නෙකුට එකතු කර ගැනීමට හැකිවන ලෙස පරිශ්‍රය තුල හෝ පරිශ්‍රයෙන් බැහැර ස්ථානයක තැබීම හෝ එවැනි එකතු කරන්නෙකුට භාර දීම අදහස් කරනු ලැබේ.

"මහනගර සභාව" හෝ "සභාව " යන්නෙන් . . . . . . . . .. මහනගර සභාව අදහස් කරනු ලැබේ.

"මහනගර සභාවේ එකතු කරන්නා" යන්නෙන් අපද්‍රව්‍ය ඇමදීම, පිරිසිදු කිරීම, එකතු කිරීම හෝ බක්කි හෝ බහාලූ වලින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා මහනගර සභාව මගින් සේවයේ යොදවා ඇති තැනැත්තෙකු හෝ යථෝක්ත සේවාවන් ඉටු කිරීම සඳහා මහනගර සභාව සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තෙකු හෝ ඔහු විසින් සේවයේ යොදවා ඇති තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"වර්ග කිරීම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා වල සඳහන් කර ඇති ආකාරයට අපද්‍රව්‍ය වෙනස් වූ වර්ග වලට වෙන් කිරීම අදහස් කරනු ලැබේ.

"සනීපාරක්ෂක ඉඩම් පිරවීම" යන්නෙන් ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව හා සමාජ, සෞඛ්‍ය හා පාරිසරික හානි අවම කළහැකි ප්‍රශස්ත ආකාරයකට අපද්‍රව්‍ය අවසාන වශයෙන් භූමියෙහි බැහැර කිරීම අදහස් කරනු ලැබේ.

D.1-132

# වැසිකිලි, කාණු, පොදු නාන ස්ථාන හා නාන ළිං ඉදි කිරීම, පවත්වාගෙන යාම සහ අපදියර බැහැර කිරීම විධිමත් කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

## වැසිකිලි, කාණු, පොදු නාන ස්ථාන හා නාන ළිං ඉදිකිරීම හා පවත්වාගෙනයාම සහ අප දියර බැහැර කිරීම විධිමත් කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මේ අතුරු ව්‍යවස්ථා, මහා නගර සභා බල ප්‍රදේශය ඇතුලත වැසිකිලි, කාණු, පොදු නාන ස්ථාන හා නාන ළිං ඉදිකිරීම හා පවත්වාගෙනයාම සහ අප දියර බැහැර කිරීම විධිමත් කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. කවර හෝ තැනැත්තකු විසින් මහා නගර සභා සීමාව තුළ, පොදු වැසිකිලියක් හෝ පොදු නාන ස්ථානයක් හෝ ළිඳක් ඉදිකරන්නේ නම් හෝ ඉදිකර පවත්වාගෙන යන්නේ නම් ඒ සඳහා භාවිත කරනු ලබන ස්ථානය හා අදාල සැලැස්ම සඳහා නාගරික කොමසාරිස්වරයාගෙන් මේ අතුරු ව්‍යවස්ථා යටතේ අනුමැතියක් ලබා ඇත්තේ නම් මිස, එවැනි කිසිදු ඉදිකිරීමක් සිදු කිරීම හෝ එවැනි ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

03. (i) පොදු වැසිකිලියක් ඉදිකිරීමට හෝ ඉදිකර පවත්වාගෙන යාමට නාගරික කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලබන කවර තැනැත්තකු වුවද, මේ අතුරු ව්‍යවස්ථාවල උපලේඛන අංක 01 හි වූ ආකෘතියෙහි ආකාරයට පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් මගින් ද, පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් ඉදිකිරීමට හෝ ඉදිකර පවත්වාගෙන යාමට නාගරික කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලබන කවර තැනැත්තකු වුවද, මේ අතුරු ව්‍යවස්ථාවල උපලේඛන අංක 02 ආකෘතියෙහි ආකාරයට පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් මගින් ද ඉල්ලුම් කළ යුතු ය.

(ii) ( i ) වන අනු ඡේදයේ පරිදි ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් අනතුරුව, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇති හා මහා නගර සභාව විසින් නියම කරනු ලබන විධිවිධාන වලට අනුකූලව ඉදිකිරීම් සැලසුම්කර ඇත්තේ නම් මිස, එකී අයදුම්පත්‍රයක් සම්බන්ධයෙන් අනුමතයක් දීම නාගරික කොමසාරිස්වරයා විසින් නොකළ යුතු ය.

(iii) පොදු වැසිකිලියක් හා පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් ඉදිකර පවත්වාගෙන යාමට නිකුත් කරනු ලබන බලපත්‍රය, මේ අතුරු ව්‍යවස්ථාවල උපලේඛන අංක 03 හි පිළිවෙලින් "අ" ආකෘතියේ හා "ආ" ආකෘතියේ සඳහන් පරිදි විය යුතු ය.

(iv) කලින් අවලංගු නොකළහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් එය නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 වන දින තෙක් වලංගු විය යුතු ය.

04. කවර හෝ තැනැත්තකු විසින් ඉදිකරනු ලබන හෝ ඉදිකර පවත්වාගෙන යනු ලබන ඕනෑම පොදු වැසිකිළියක් පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක්;

(අ) ඇතුළතට නල මගින් ජලය සපයාගනු ලැබීමට පහසුවන පරිදි හා නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමාණයකින් හා ආකාරයෙන් යුතු ජල ටැංකියක් සවිකර තිබිය යුතු අතර එමගින් එකී වැසිකිළියට අඛණ්ඩ ජල සැපයුමක් ලබා දී තිබිය යුතු ය.

(ආ) ඇතුළත මලපහ කිරීමේ පෝච්චි හෝ කැසිකිළි පෝච්චි හෝ ඊට සමාන උපාංග සවිකර ඇත්තේ නම්, නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන කාලාන්තරයෙන් එකී පෝච්චි ජලය යොදා සේදීම කළ යුතු ය.

(ඇ) භාවිත කරන්නන්ගෙන් යම් ගාස්තුවක් අයකරනු ලබන්නේ නම් එකී ගාස්තු ක්‍රමය, වැසිකිළියේ හා පොදු නාන ස්ථානයේ හෝ නාන ළිඳේ ඉදිරිපස භාෂාත්‍රයෙන්ම සඳහන් කළ දැන්වීමක් මගින් ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම ගාස්තු ක්‍රමය කලින් කල සභාව විසින් නියම කරනු ලැබිය හැකි අතර එය ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය.

(ඈ) උපලේඛන අංක 01 හි හා 02 හි දක්වා ඇති, පොදු වැසිකිළියේ හෝ පොදු නාන ස්ථානයේ හෝ පොදු නාන ළිඳේ අයිතිකරු හෝ භාරකාරත්වය දරන අය, මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපදිනු ලබන බවට නාගරික කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. එකී අයිතිකරුගේ හෝ භාරකාරත්වය දරන අයගේ හෝ කළමනාකරුගේ හෝ පවිත්‍රකරුවන්ගේ වෙනස්වීම් පිළිබඳ තොරතුරු, එකී වෙනස්වීම ඇතිවී දින දහ හතරක් ගතවීමට මත්තෙන් නාගරික කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර නව අයිතිකරු හෝ භාරකරු ද නාගරික කොමසාරිස්වරයා සමග එකී ගිවිසුමට එළැඹිය යුතු ය.

D.1-133



05. සෑම පොදු වැසිකිළියක, පොදු නාන ස්ථානයක හෝ පොදු නාන ළිඳක පිහිටීම, ස්වභාවය හා අයිතිකරු හෝ භාරකාරත්වය දරණ අය, කළමනාකරු සහ පවිත්‍රකරන්නන් පිළිබඳ තොරතුරු මෙහි උපලේඛන අංක 04 ට අනුව පිළියෙල කරගත් ලේඛනයක ඇතුළත් කර යාවත්කාලීනව පවත්වාගෙන යාම නාගරික කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය.

06. සෑම පොදු නාන ස්ථානයක් හෝ ළිඳක් හෝ වැසිකිළියක් මේ අතුරු ව්‍යවස්ථාවල සහ අදාල බලපත්‍රයේ සඳහන් කොන්දේසි වලට මුළුමනින්ම එකඟවන ආකාරයෙන් බලපත්‍රධාරියා විසින් නඩත්තු කර පවත්වා ගත යුතු ය.

07. සෑම පොදු වැසිකිළියක් හෝ පොදු නාන ස්ථානයක් හෝ ළිඳක් අධීක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලක් ඇතිකර, ඒ අනුව ක්‍රියා කිරීම හෝ තම කාර්ය මණ්ඩලයේ නිලධාරීන් යොදවා ක්‍රියා කරවීම හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කළ යුතු ය.

08. සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණයකට අනුව ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරන ලද ගාස්තුවක් අයකරමින් බල ප්‍රදේශය තුල පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් හෝ වැසිකිළියක් ඉදිකර පවත්වාගෙන යාමට හෝ ඉදිකර ඇති පොදු නාන ස්ථානයට හෝ නාන ළිඳට හෝ වැසිකිළියකට එකී ගාස්තු ක්‍රමය අදාල කරවීමට මහා නගර සභාවට බලය ඇත්තේ ය.

09. සභාව හැර වෙනත් කිසියම් තැනැත්තකු විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන පොදු වැසිකිළියක් හෝ නාන ස්ථානයක් හෝ නාන ළිඳක් භාවිත කරන්නන්ගෙන් ගාස්තුවක් අයකරනු ලබන්නේ නම්, එකී ගාස්තු ක්‍රමය හා කලින් කලට එකී ගාස්තු ක්‍රමයට කෙරෙන සංශෝධන පිළිබඳව සභාව වෙත පූර්ව දැනුවත් කිරීමක් කළ යුතු අතර, එකී සෑම තැනැත්තකු විසින් ම නාගරික කොමසාරිස්වරයා වෙත ගාස්තුවක් කලින් ගෙවා ඔහුගෙන් බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ නම් හා ඒ ගාස්තු පිළිබඳව 04 වන අතුරු ව්‍යවස්ථාවේ ( ඇ ) අනු ඡේදය යටතේ වූ දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇත්තේ නම් මිස, එකී ගාස්තු අය කිරීම නීත්‍යානුකූල නොවේ.

10. සෑම පොදු වැසිකිළියක් ම භාවිත කරන තැනැත්තන් විසින්, එකී වැසිකිළියේ ;

(අ) අවට අපිරිසිදු කිරීම නොකළ යුතු ය.

(ආ) මලපහ කිරීමේ පෝච්චියකට හැර වෙනත් ස්ථානයක මල පහ කිරීම නොකළ යුතු අතර කැසිකිළි පෝච්චි සවි කර ඇත්තේ නම්, එකී කැසිකිළි පෝච්චියකට හෝ මලපහ කිරීමේ පෝච්චියකට හෝ ඒ සඳහා පිළියෙල කර ඇති වෙනත් උපාංගයකට හෝ හැර වෙනත් ස්ථානයකට මුත්‍රා කිරීම නොකළ යුතු ය.

(ඇ) පාවිච්චි කිරීමෙන් පසු, ජලය යෙදීමෙන් මලපහ කිරීමේ පෝච්චිය හෝ කැසිකිළි පෝච්චිය හෝ ඒ වෙනුවෙන් පිළියෙල කළ වෙනත් උපාංගය සෝදා හැරිය යුතු ය.

(ඈ) රෙදිපිළි හෝ වෙනත් එබඳු ද්‍රව්‍ය හෝ භාජන හෝ වෙනත් උපකරණ හෝ සේදීම හෝ සතුන් නෑවීම නොකළ යුතු ය.

(ඉ) වැසිකිළියේ මලපහ කිරීමේ පෝච්චි හෝ කැසිකිළි පොච්චි හෝ වෙනත් උපාංග තුළට හෝ කාණුවලට හෝ ගලි තුළට හෝ වෙනත් විවර තුළට ඒ තුළින් මළ අපද්‍රව්‍ය හෝ ජලය ගලා යාම වැළැක්වෙන කිසියම් ද්‍රව්‍යයක් දැමීම නොකළ යුතු ය.

(ඊ) උපකරණවලට හෝ බිත්තිවලට හෝ බිමට හෝ වහලයට හෝ වැසිකිළියේ ඇතුළත හා පිටත පිහිටි කිසියම් සවිකිරීමකට කිසිදු හානියක් හෝ වෙනස් කිරීමක් හෝ නොකළ යුතු ය.

(උ) මහා නගර සභාවේ කාර්ය මණ්ඩලයේ හෝ පොදු වැසිකිළියේ කාර්ය මණ්ඩලයේ පිරිමි අයකු වන හා ජීවකීය රාජකාරිය සඳහා ඇතුල්වන තැනැත්තකු නොවන කවර හෝ තැනැත්තකු, ස්ත්‍රී පක්ෂයේ ප්‍රයෝජනය පිණිස වෙන්කර තිබෙන්නා වූ යම් වැසිකිළි කාමරයකට හෝ එහි කොටසකට හෝ ඇතුළ් නොවිය යුතු ය.

(ඌ) පොදු වැසිකිළියේ කාර්ය මණ්ඩලයේ අයකු විසින් තම රාජකාරි කරන අතරතුර දී කරනු ලබන යම් නීත්‍යනුකූල නියෝගයකට මිතැ කමින් බාධා කිරීම, නුසුදුසු ලෙස මැදිහත් වීම හෝ අකීකරු වීම නොකළ යුතු ය.

D.1-134



(එ) වැසිකිළිය සපයා ඇති කාර්යයට හැර කිසිම තැනැත්තකු විසින් එහි තුළ හෝ අවට නිතර ගැවසීම හෝ රැඳී සිටීම හෝ වෙනත් කවර හෝ කාර්යයක නියුතු වීම හෝ නොකළ යුතු ය.

(ඒ) කිසියම් බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තකු පොදු වැසිකිළියක් තුළට ඇතුල්වීම හෝ එය භාවිත කිරීම හෝ නොකළ යුතු ය.

11. කිසියම් ස්ථානයක පොදු වැසිකිළියක් හෝ නාන ස්ථානයක් හෝ නාන ළිඳක් ඉදිකිරීමෙන් ඒ අවට වාසය කරන මහජනතාවගේ සෞඛ්‍යයට හා පහසුකම්වලට බාධාවක් හෝ ඔවුනට පීඩාවක් ඇති නොවන බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා විසින් නිකුත් කළ සහතිකයක් අමුණා ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තකු විසින් 03 වන අතුරු ව්‍යවස්ථාවේ ( i ) වන අනු ඡේදයේ සඳහන් පරිදි වූ අයදුම්පත්‍රයක් සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් අවසර ලබා නොදිය යුතු අතර, එවැනි ඉදිකිරීමකට ඉඩදීම ද නොකළ යුතු ය.

12. මහජනයා බහුල වශයෙන් පැමිණෙන හෝ පැමිණීමට ඉඩ ඇති එසේ නැතහොත් සේවකයන් විශාල සංඛ්‍යාවක් නියුක්ත කරවන කවර හෝ ඉඩමක හෝ ගොඩනැගිල්ලක, එකී තැනැත්තන්ගේ පහසුව පිණිස වැසිකිළි එකක් හෝ ඊට වැඩි ගණනක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ නිර්දේශය මත සභාව විසින් නියම කරනු ලබන ආකාරයට ඉදිකර පවත්වාගෙන යාමට එකී ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරුට නියම කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

13. (i) පොදු වැසිකිළියක් හෝ නාන ස්ථානයක් හෝ නාන ළිඳක් පිහිටි යම් ඉඩමක හෝ නිවසක හෝ ගොඩනැගිල්ලක හෝ අයිතිකරු හෝ පදිංචිකරු විසින්, ඒ අවට ප්‍රදේශයේ පදිංචිව සිටින හෝ ඒ අසලින් එහා මෙහා ගමන් කරන තැනැත්තන්ට හෝ ඒ නාන ස්ථානයේ හෝ නාන ළිඳේ හෝ වැසිකිළියේ ඇතුළත නොපෙනෙන ලෙස ප්‍රමාණවත් වහලයකින් සහ බිත්තියකින් හෝ වැටකින් එය ආවරණය කර තැබිය යුතු අතර, එකී අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් විවෘත නාන ස්ථානයක් හෝ නාන ළිඳක් හෝ වැසිකිළියක් යම් වීදියක් දෙසට හෝ ආසන්නයේ ඇති නිවසක් දෙසට විවෘත වූ දොරක් හෝ බිම් දොරක් සහිතව තබා ගැනීම නීත්‍යනුකූල නොවිය යුතු ය.

(ii) ඉහත ( i ) වන අනු ඡේදයේ විධිවිධානවලින් කිසිවක් පිළිපැදීම පැහැර හරින හෝ නොසලකා හරින යම් ඉඩමක හෝ නිවසක හෝ ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු වරදකට වරදකරු විය යුතු අතර, ඒ කට කිරීම නොකඩවා කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහක උපරිමයක් සහිත වූ දඩයකට යටත් විය යුතු ය.

14. සෑම අවස්ථාවකදී ම පොදු වැසිකිළි, පොදු නාන ස්ථාන හා පොදු නාන ළිං නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් නඩත්තුකර පවත්වා ගත යුතු ය.

15. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා විසින් සභාවට කරනු ලබන හෝ සභාව විසින් ඔහුගෙන් කරනු ලබන ඉල්ලීමකට හෝ ඔහු විසින් දෙනු ලබන නිර්දේශයක් අනුව සභාව විසින් කරනු ලබන නියමයක් අනුව බල ප්‍රදේශය ඇතුලත ඇති සියලුම පොදු නාන ස්ථාන හෝ නාන ළිං, නියම කරනු ලබන කාලයක් ඇතුලත සෞඛ්‍ය හා සනීපාරක්ෂාව තහවුරු වන පරිදි පිරිසිදු කිරීමටත්, සියලුම වැසිකිළි සෞඛ්‍යය හා සනීපාරක්ෂාව තහවුරු වන පරිදි දුගඳ හැමීමකින් තොරව සෞඛ්‍යාරක්ෂක රසායනික ද්‍රව්‍ය යොදා පිරිසිදු කිරීමටත්, අලුත්වැඩියා කිරීමටත්, වෙනසක් ඇති කිරීමටත් හා සියලුම වල වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට පරිවර්තනය කිරීමටත්, එකී වැසිකිළිය හෝ නාන ස්ථානය හෝ ළිඳ ඉදිකර ඇති ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ හෝ නිවසේ අයිතිකරුට දැන්වීමක් මගින් නියම කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

16. කිසියම් වැසිකිළියක භාවිත කළ ජලය, මළ හෝ මුත්‍රා කිසියම් පොදු ස්ථානයකට මුදා හැරීම වරදක් වන්නේ ය.

17. (i) මහා නගර සභාව විසින් බල ප්‍රදේශය ඇතුලත මහජනයා වැඩිපුර ගැවසෙන ස්ථානවල ප්‍රමාණවත් පොදු වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර පවත්වාගැනීම කළ යුතු ය. එසේ කිරීමට මහා නගර සභාවට නොහැකි වන අවස්ථාවක, අංක 02 සිට 10 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට යටත්ව බාහිර පාර්ශ්වයන් ලවා ප්‍රමාණවත් පොදු වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර පවත්වාගැනීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම මහා නගර සභාවේ වගකීම වන්නේ ය.

D.1-135



(ii) ඉහත ( i ) වන අනු ඡේදය යටතේ ප්‍රමාණවත් පොදු වැසිකිළි සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලබන විට දී, කවරකු විසින් හෝ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුලත පොදු හෝ පෞද්ගලික වැසිකිළියකින් බැහැර වූ කිසියම් ස්ථානයක මළ පහ කිරීම හෝ මුත්‍රා කිරීම වරදක් වන්නේ ය.

18. කිසියම් වැසිකිළි වලක් පිරී ඇති විටක, එකී වල හිස් කිරීමකදී හෝ අවශ්‍ය කරන වෙනත් අලුත්වැඩියාවකදී කරනු ලබන විවෘත කිරීමක් මිස, සෑම අවස්ථාවකදී ම එකී වල වාතයට නිරාවරණය නොවන පරිදි පවත්වා ගත යුතු ය.

19. කිසියම් වැසිකිළි වලක් පිරී ඇති විට, එකී වැසිකිළි වල නගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් හිස් කළ යුතු අතර එකී මළ අප ද්‍රව්‍ය එම ඉඩමේ ම වෙනත් වලකට බැහැර කරන විට, නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලබන ආකාරයෙන් ඉවත් කළ යුතු ය. එසේ හිස් කිරීමකදී ඉවත් කරනු ලබන මළ අපද්‍රව්‍ය මළාපවාහන ටැංකියක් සහිත වූ වාහනයකින් පිටතට ගෙනයනු ලබන විට, එකී මළ අපද්‍රව්‍ය නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ස්ථානයකට හැර අන් තැනක නොදැමිය යුතු ය. තවද එකී මළ අපද්‍රව්‍ය කිසියම් පොදු ස්ථානයකට මුදා හැරීම වරදක් වන්නේ ය.

20. කිසියම් ළිඳකින් ඉවතට ගනු ලබන ජලය, එකී ස්ථානය අවට රැඳී තිබීමෙන් හෝ රැඳී තිබීමට ඉඩ හැරීමෙන්, එකී ජලයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් බෝවීමට ඉඩ හැරීම හෝ එකී බෝවීම වැලැක්වීමට ක්‍රියා නොකිරීම වරදක් වන්නේ ය.

21. නඩත්තු කිරීමේ කාර්යයක් සඳහා හෝ අලුත්වැඩියා කිරීමේ කාර්යයකට හෝ නාගරික කොමසාරිස්වරයා විසින් වෙනයම් හේතුවක් නිසා වසා තැබීමට නියෝග කර ඇත්තේ නම් මිස, කිසියම් වැසිකිළියක් හෝ නාන ස්ථානයක් හෝ නාන ළිඳක් එක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් පාවිච්චියට නොගෙන තිබෙන අවස්ථාවක, එකී වැසිකිළිය හෝ නාන ස්ථානය හෝ නාන ළිඳ වසා තැබිය යුතු යයි නාගරික කොමසාරිස්වරයාට හැඟී යන්නේ නම්, එකී වැසිකිළිය හෝ නාන ස්ථානය හෝ නාන ළිඳ වසා දැමීමට නියෝග කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

22. (i) තත් කාර්යය සඳහා වෙන්කොකරන ලද යම් පොදු ස්ථානයක හෝ දැන්වීමේ සඳහන් වේලාවන් ඇතුලත හැර වෙනත් වේලා වල දී හෝ දැන්වීමේ සඳහන් තැනැත්තන් හැර වෙනත් තැනැත්තන් විසින් හෝ, නෑම හෝ සතුන් නැවීම හෝ රෙදි සේදීම ද පොදු ස්ථානවල ජලය ප්‍රයෝජනයට නුසුදුසු තත්වයට පත් කරන හෝ, නාන ස්ථාන හෝ සෝදන ස්ථාන භාවිතකරන තැනැත්තන්ට අපහසුවන හෝ හිරිහැරවන තත්වයන් ඇති කරන වෙනත් සියලු ක්‍රියා ද සභාව විසින් ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තහනම් කළ හැකි ය. ඒ දැන්වීම භාෂාත්‍රයෙන් ම ගැසට් පත්‍රයේ ද, යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ හා එක් ඉංග්‍රිසි පුවත් පතක ද පළ කරනු ලැබිය යුතු ය.

(ii) (i) අනු ඡේදය යටතේ පළ කරනු ලැබූ දැන්වීමක නියමයන්ට පටහැනිව නෑම, සේදීම හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඊට වරදකරු කරනු ලැබූ විට, රුපියල් දහසක් නොඉක්මවන දඩයකට මතු යටත් විය යුතු ය.

23. බල ප්‍රදේශය ඇතුලත පවත්වාගෙන යනු ලබන ජල කර්මාන්තයක කාර්යය සඳහා භාවිත කරනු ලබන යම් ජල මූලාශ්‍රයක හෝ ජලාශයක හෝ එම ජල මූලාශ්‍රයට හෝ ජලාශයට ජලය ගලා එන හෝ ජලය සපයන යම් දිය පහරක හෝ ජල මාර්ගයක නෑම, රෙදි හෝ වෙනත් ද්‍රව්‍ය සේදීම හෝ සතුන් නැවීම හෝ යම් කුණු හෝ වෙනත් අප ද්‍රව්‍ය හෝ වෙනත් අපවිත්‍ර ද්‍රව්‍ය ඊට ගලා යාමට සැලැස්වීම හෝ ඉව හැරීම හෝ වෙනත් ආකාරයකින් එය අපවිත්‍ර කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඊට වරදකරු කරනු ලැබූ විට, පළමුවන අවස්ථාවේදී රුපියල් දහසක් නොඉක්මවන දඩයකට ද, දෙවනවරට හෝ තදනන්තරව වරදකරු කළවිට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකටද මතු යටත් විය යුතු ය. තවද එකී වරද තව දුරටත් කරගෙන යන අවස්ථාවක, ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ වරදට අවධානය යොමු කරවමින් නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු ඒ වරද කරගෙන ගිය එක් එක් දිනයට රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද මතු යටත් විය යුතු ය.

D.1-136



24. පොදු මාර්ගයක හිමිකම ඇති කවර හෝ අධිකාරයක් විසින්, එකී සෑම පොදු මාර්ගයක ම දෙපස ජලය බැසයන කාණු ඉදිකිරීම ද ඒවා නිසි ආකාරයෙන් කාලීනව අලුත්වැඩියා කිරීම ද කළ යුතු වන්නේ ය.

25. කිසියම් මාර්ගයක මීටර් සියයක් දිගක අතර තුර එකී මාර්ගයේ දෙපස නේවාසික ස්ථාන හෝ ව්‍යාපාරික ස්ථාන හෝ නේවාසික ස්ථාන හා ව්‍යාපාරික ස්ථාන විස්සක් හෝ ඊට වැඩියෙන් ඇති විටක, එකී මාර්ගයේ දෙපස ඇති කාණු සිමෙන්තියෙන් බැඳ නිම කරන ලෙස එකී මාර්ගයේ හිමිකම ඇති අධිකාරයට නියෝග කිරීමට මහා නගර සභාවට බලය ඇත්තේ ය.

26. කිසියම් මාර්ගයක් ඔස්සේ ඇති කාණුවක හෝ කාණුවල අප ජලය ගලා යාමට අවහිර කිරීම හෝ බාධා කිරීම හෝ එසේ ගලා යාම වැලැක්වීමට ඉඩදීම හෝ ජලය බැසයාම වෙනස් වීමට ඉඩ ඇති කවර හෝ ක්‍රියාවක් කිරීම හෝ අප ජලය රැඳී තිබීමට ඉඩදීම හෝ වරදක් වන්නේ ය.

27. පොදු මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට හෝ කාණුවලට යාබද ඉඩම්වල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ එකී මාර්ගයේ ගමන් ගන්නන්, එකී කාණුවකට කවර හෝ අපද්‍රව්‍යයක් දැමීම නොකළ යුතු ය.

28. පොදු කාණුවක ජලය බැසයාම පිණිස කවර හෝ පෞද්ගලික ඉඩමක් මැදින් හෝ ඉඩමකට යටින් හෝ ජලය බැසයන ජල මාර්ග ඉදිකිරීමට සභාවට බලය තිබිය යුතු ය.

29. 28 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉදිකරන ලද ජල මාර්ගයකට හෝ ජල මාර්ගවලට එකී ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින් අලාභ හානි කිරීම හෝ එකී ජල මාර්ගයක ජලය බැසයාම වැලැක්වීම හෝ එකී ජලමාර්ගයන් වෙනස් කිරීම හෝ එකී කවර හෝ කාරණයක් සිදුවීමට ඉඩදී තිබීම හෝ වරදක් වන්නේ ය.

30. පොදු කාණුවකින් හෝ ස්වාභාවික දිය පහරකින් හෝ පිල්ලකින් ගලා එන ජල මාර්ගයක් කිසියම් ඉඩමක් මැදින් ගලා බසින විට, එකී ජල මාර්ගයට අවහිර කිරීම හෝ බාධා කිරීම හෝ එකී ජල මාර්ගය වෙනස් කිරීම හෝ වරදක් වන්නේ ය.

31. කිසියම් පොදු කාණුවකට හෝ කාණුවක කොටසකට හෝ අවහිරවන ආකාරයේ හෝ කිසියම් කාණුවක් මත කවර හෝ තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සිදු කිරීම වරදක් වන්නේ ය. ඒ ආකාරයට කරනු ලැබූ ඉදිකිරීමක් ඉවත් කරන ලෙස, එකී ඉදිකිරීම කළ අයට හෝ එකී ඉදිකිරීමේ භාරකරුට හෝ දැන්වීමක් මගින් නියම කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

32. කවර හෝ පෞද්ගලික ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිවසක හෝ වර්ෂාව නිසා එකතුවන ජලය හැර, අප ජලය හෝ වෙනත් කවර හෝ අප දියරයක් කිසියම් පොදු ස්ථානයකට මුදා හැරීම හෝ ගලා ඒමට සැලැස්වීම හෝ ගලා ඒමට ඉඩදී තිබීම හෝ වරදක් වන්නේ ය. ඒ ආකාරයේ වරදක් කරනු ලැබ ඇති විට, එකී වරද කිරීම වහාම නතර කරන ලෙස හා එකී අප ජලය හෝ වෙනත් අප දියර රඳවා තැබීමට, එකී ඉඩමේ හෝ ස්ථානයේ අප දියර වලක් නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ඉදිකරන කරන ලෙස, එකී වරද කළ අයට හෝ එකී ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ හෝ නිවසේ අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් මගින් නියම කිරීමට බලය ඇත්තේ ය.

D.1-137

33. කවර හෝ ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට හෝ නිවසකට, පොදු කාණුවක් හරහා ප්‍රවේශවීමට, නාගරික කොමසාරිස්වරයා විසින් එකී ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ හෝ නිවසේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලබන ආකාරයට පාලමක් හෝ පාලම් තනා ගත යුතු ය.

34. කිසියම් ඉඩමක් අනුබෙදීමක් කිරීමේ දී හෝ එකී ඉඩම තුළ කවර හෝ ඉදිකිරීමක් කිරීමේ දී, ස්වාභාවික ලෙස එකී ඉඩම මැදින් ගලා යන වැසි ජලය හෝ දිය පහරක් හෝ වෙනස් කිරීමක් අවශ්‍යවන අවස්ථාවක, ඒ කාර්යය කිරීමට සභාව විසින් නියම කරනු ලබන ආකාරයට එකී ඉඩමේ අයිතිකරු විසින් හෝ අනුබෙදුම්කරු විසින් හෝ එකී ඉදිකිරීම කරනු ලබන අය විසින්, එකී කාර්යයේ නියුතු තැනැත්තාගේ වියදමින් එකී ජලය නිර්බාධිතව ගලා යාමට හා එමගින් කිසිවකුට හෝ කිසියම් පීඩාවක් ඇති නොවන ආකාරයට කාණුවක් හෝ කාණු බැඳීම කළ යුතු අතර, එකී ආකාරයෙන් නියමයක් කිරීමට සභාවට බලය ඇත්තේ ය.



35. (i) බල ප්‍රදේශය ඇතුලත පිහිටි සිමෙන්තියෙන් බැඳ නිම කළ සියලුම පොදු කාණු සෝදා හැරීම හා අලුත්වැඩියා කිරීම ද සහ වෙනත් කාණු පහසුවෙන් ජලය ගලා යාමට හැකිවන පරිදි නඩත්තු කිරීම හා ගොඩවී ඇති පස් හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීම ද සභාවේ වියදමින් කළ යුතු ය.

(ii) ඉහත ( i ) වන අනු ජේදයේ පරිදි කිසියම් කාණුවක් සෝදා හැරීමේ දී හෝ නඩත්තු කිරීමක දී, ඉවත් කරනු ලබන ගොඩවී ඇති පස් හෝ වෙනත් ද්‍රව්‍ය හෝ අලුත්වැඩියා කිරීමක දී ගෙන එන ද්‍රව්‍ය වලින් ඉතිරිවන දේ, එකී කාර්යය නිමවීමෙන් අනතුරුව පැය විසි හතරක් ගත වීමට මත්තෙන් ඒ ස්ථාන වලින් ඉවත් කිරීම හෝ ඉවත් කරවීමට ක්‍රියා කිරීම නාගරික කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය.

36. (i) සේවා ස්ථානයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එකී ස්ථානයේ වාහන සෝදා මැහැර කරන අප ජලය ගලායාම පිණිස සිමෙන්තියෙන් බැඳ නිමකළ කාණු පද්ධතියක් සහිතව ජලය රැස්කිරීමට ප්‍රමාණවත් සිමෙන්තියෙන් නිමකළ මුද්‍රා තබන ලද වළක් හෝ ටැංකියක් පිළියෙල කර තිබිය යුතු ය. ඒ ටැංකිය හෝ වළ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ඉදිකර තිබිය යුතු ය.

(ii) මේ ස්ථානයේ අප ජලය ගලා යන කාණුවල වැලි හෝ පස් හෝ වෙනත් අප ද්‍රව්‍ය හෝ රැඳී තිබීම වැලැක්වීමට නිරන්තරයෙන් පවිත්‍ර කළ යුතු අතර එසේ ඉවත් කරන දේ කිසියම් පොදු ස්ථානයකට මුදා හැරීම හෝ ගලා ඒමට සැලැස්වීම හෝ ගලා ඒමට ඉඩදී තිබීම හෝ වරදක් වන්නේ ය.

37. කිසියම් සේවා ස්ථානයක හෝ වැඩ පොළක, සේවා කරන හෝ අළුත්වැඩියා කරන වාහනයක පාවිච්චි කළ ලිහිසි තෙල් ඉවත්කර ගැනීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, එසේ ඉවත් කරනු ලබන ලිහිසි තෙල් රැස්කර තබා ගැනීමට ප්‍රමාණවත් ටැංකි පිළියෙල කර තිබිය යුතු ය. මෙසේ රැස්කර තබාගනු ලබන පාවිච්චිකළ ලිහිසි තෙල් නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට අපහරණය කළ යුතු ය.

38. කිසියම් සේවා ස්ථානයක සේවා කිරීමට භාවිතකරන ජලය මාර්ගයකට හෝ වෙනත් ඉඩමකට විසිරීම වැළැක්වීමට එකී කාර්යය කරනු ලබන ස්ථානයේ යටත් පිරිසෙයින් අඩි අටක් උස්වූ තාප්පයක් බැඳ හෝ ස්ථිර ආවරණයක් යොදා තිබිය යුතු ය.

39. සේවා ස්ථානයේ භාවිතය සඳහා අවශ්‍ය කරන ඛණිජ තෙල් නිෂ්පාදන සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ ප්‍රමාණවත් ආරක්ෂාවක් සහිතව ගබඩාකර තැබීමේ ගබඩා පහසුකම් පවත්වාගෙන යායුතුවාත් හැර, පාවිච්චියට නොගන්නා විටදී එකී ද්‍රව්‍ය ගබඩාවල තැන්පත්කර තැබිය යුතු ය.

40. කිසියම් වැඩ පොළක හෝ සේවා ස්ථානයක වාහන අලුත්වැඩියා කිරීමක දී හෝ සේවා කිරීමක දී ඉවත් කරන පාවිච්චිකළ ලිහිසි තෙල් හෝ වාහන කොටස් සේදීම හෝ පිරිසිදු කිරීමට යොදාගනු ලබන ඛණිජ තෙල් හෝ ඒ සඳහා යොදා ගන්නා රෙදි කැබලි හෝ වෙනත් ද්‍රව්‍ය කිසියම් පොදු ස්ථානයකට මුදා හැරීම හෝ ගලා ඒමට සැලැස්වීම හෝ ගලා ඒමට ඉඩදී තිබීම හෝ සහ බල ප්‍රදේශය තුල කසල රැඳවනයකට විධිමත් වූ අවසරයකින් තොරව දැමීම හෝ වැඩ පොළෙහි පරිශ්‍රය තුල නොසැලකිලිමත් අන්දමින් රැඳී තිබීමට ඉඩ හැරීම හෝ සැලැස්වීම වරදක් වන්නේ ය.

D.1-138

41. (i) කිසියම් වාහනයක් හෝ වාහනයක කොටසක් හෝ වැඩ පොළක පරිශ්‍රයෙන් පිටතදී, පින්තාරු කිරීම නොකළ යුතු ය. වැඩ පොළක පරිශ්‍රය ඇතුලත එකී පින්තාරු කිරීම් කරනු ලබන්නේ නම්, ඒ සඳහා වෙන්කළ කොටසක් පරිශ්‍රය ඇතුලත පිලියෙල කර තිබිය යුතු අතර එහිදී නිපදවෙන තින්තවල වාෂ්ප වැඩ පොළෙහි සේවකයන්ගේ සහ වැඩ පොල ආසන්නයේ පදිංචිකරුවන්ගේ ශරීර සෞඛ්‍යයට හානිවන පරිදි හෝ පිටාවන පරිදි පරිසරයට බැහැරවීම වැළැක්වීමට නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන විධිවිධාන යොදා තිබිය යුතු ය.



(ii) වැඩ පොළෙහි භාවිතය පිණිස ගෙනැවිත් ඇති ඛණිජ තෙල් නිෂ්පාදන හෝ වායු සමීකරණ යන්ත්‍ර සඳහා වන සම්පීඩන වායු වර්ග හෝ පැස්සුම් කටයුතු සඳහා භාවිත කරන වායු වර්ග හෝ වෙනත් ද්‍රව්‍යයන් හෝ දියරයන් හෝ සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ ප්‍රමාණවත් ආරක්ෂාවක් සහිතව ගබඩා කර තැබිය යුතු අතර, පාවිච්චියට නොගන්නා විට දී එකී ද්‍රව්‍ය ගබඩාවල ගබඩාකර තැබිය යුතු ය.

(iii) අලුත්වැඩියාවක දී වායු සමීකරණ යන්ත්‍ර සඳහා භාවිත කරන සම්පීඩිත වායු වර්ග, වැඩ පොළෙහි සේවකයන්ගේ හෝ වැඩ පොල ආසන්නයේ පදිංචිකරුවන්ගේ ශරීර සෞඛ්‍යයට හානිවන පරිදි හෝ පිටා වන පරිදි පරිසරයට බැහැරවීම වැළැක්වීමට නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන විධිවිධාන යොදා තිබිය යුතු ය.

42. බල ප්‍රදේශය ඇතුලත වූ කිසියම් ඉඩමකට වර්ෂා ජලය හෝ වෙනත් යම් ආකාරයකින් ඉඩමට ඇතුළුවිය හැකි ජලය නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට පවිත්‍රව රැඳවා තබා ගන්නේ නම් මිස, එකී ඉඩමේ ජලය රැඳවා ගැනීම හෝ රැඳීමට ඉඩදී තිබීම නොකළ යුතු ය.

43. වර්ෂාව හේතුවෙන් කිසියම් ඉඩමක් මැදින් ගලා යන දිය අගලක ජලය, එකී ඉඩමට ගලා ඒම හේතුවෙන් එකී ඉඩමේ ජලය රැඳී ඇත්නම් මිස, කෘෂි කාර්මික කාර්යයකට හැර එකී දිය අගලේ ජලය ඉඩමේ රැඳවා ගැනීම හෝ රැඳීමට ඉඩ දී තිබීම වරදක් වන්නේ ය. එසේ වුවද වර්ෂාව හේතුවෙන් එකී දිය අගල උතුරායාමෙන් ඉඩමට ඇතුළුවූ ජලය නිසි කාලයෙන් නැවත දිය අගලට බැස යාමට විධිවිධාන සැලැස්වීම කළ යුතු අතර එසේ ජලය ගලා යාමට ඇති බාධා ඉවත් කළ යුතු ද වේ.

44. වර්ෂාව හේතුවෙන් කිසියම් ඉඩමක රැස්වන ජලය නිසි ආකාරයෙන් පොළොවට උරා ගැනීමට හෝ මාර්ග මස්සේ ඇති කාණු දිගේ බාධාවකින් තොරව ගලා යාමට ද, එසේ ගලා යාමට ඇති බාධා ඉවත්කර තැබීමට ද ක්‍රියා කළ යුතු ය. එසේම එකී වර්ෂා ජලය රැඳී තිබීමට ඉඩ ඇති භාජන හෝ ද්‍රව්‍ය හෝ වෙනයම් දෙයක් තම ඉඩමේ රැඳවා තබා නොගත යුතු අතර, නිරන්තරයෙන් ඉඩම කැලෑ වැවී තිබීමෙන් වලක්වා පිරිසිදුව පවත්වා ගත යුතු ය.

D.1-139

45. කිසියම් ඉඩමක ජලය රඳවා තබා ගන්නා ටැංකි හෝ භාජන හෝ දිය කඩිති හෝ පොකුණු පවත්වාගෙන යනු ලබන විට, ඒවායේ මදුරුවන් බෝවීම වැලැක්වීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සෑහීමට පත්වන ආකාරයෙන් ක්‍රියාකිරීමට හෝ එසේ නැත්නම් සතියකට එක් වතාවක් බැගින්වත් එකී ස්ථාන හිස් කිරීමටත්, එසේ ඉවත් කරනු ලබන ජලය විධිමත් පරිදි පොළොවට උරාගැනීමට සලස්වනු ලබන බවටත්, එකී ජලය කිසියම් පොදු ස්ථානයකට ගලා ඒමට යාමට ඉඩ නොතැබීමටත් ක්‍රියා කළ යුතු ය.

46. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් ඉඩමක් හෝ නිවසක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එකී ඉඩම හෝ නිවස මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝණය වන ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන බවට ඒත්තුගෙන ඇත්නම්, එකී උල්ලංඝනය කිරීම් නියමිත කාලයක් ඇතුලත නිවැරදි කරන ලෙසට ඔහු විසින් එකී ඉඩමේ හෝ නිවසේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් දන්වා සිටිය යුතු ය.

47. (i) බල ප්‍රදේශය ඇතුලත කවර හෝ පොදු කාණුවක් පරීක්ෂා කිරීමකට, කවර හෝ පෞද්ගලික කාණුවක් හෝ පොදු නාන ස්ථානයක් හෝ ළිඳක් හෝ වැසිකිළියක් හෝ වැසිකිළි වලක් පරීක්ෂා කරනු ලැබීමටත්, එකී ස්ථානයක කිසියම් අලුත්වැඩියාවක් හෝ නඩත්තු කාර්යයක් කිරීම පිණිස අවශ්‍යවන කිසියම් භාණ්ඩයක් හෝ යන්ත්‍රෝපකරණයක් හෝ වාහනයක් හෝ එකී කාර්යයට අවශ්‍ය විය හැකි සහායකයන් හෝ සේවකයන් ද එකී ඉඩමට හෝ ගොඩනැගිල්ලට රැගෙන ඒමටත් හා රඳවා තැබීමටත්, එවැනි ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට පෙරවරු හයේ සිට පස්වරු හය දක්වා අතර කාලයේ ඇතුල්වීමටත් හා එකී තැනැත්තා විසින් සුදුසුයයි සිතන අවස්ථාවක දී හැකිතාක් අඩුවෙන් අලාභ සිදුකරමින් පොළොවේ යම් යම් කැනීම් කිරීමටත් නාගරික කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තකුට බලය ඇත්තේ ය.



(ii) ඉහත ( i ) වන අනු ඡේදය යටතේ කරනු ලැබූ පරීක්ෂණයකදී කිසියම් පෞද්ගලික ඉඩමක් හෝ පෞද්ගලික කාණුවක් හෝ පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් හෝ වැසිකිළියක් හෝ වැසිකිළි වලක් නිසි තත්වයෙන් නොපවතින්නේයයි හෝ එය මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝණය වන පරිදි පවත්වාගෙන යන්නේයයි පෙනී ගිය විට එකී පරීක්ෂණය සඳහා සභාව විසින් දරන ලද වියදම්, එකී පෞද්ගලික කාණුව හෝ පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ හෝ වැසිකිළිය හෝ වැසිකිළි වල අයිතිව තිබිය හැකි තැනැත්තාගෙන් අයකර ගත යුතු ය.

(iii) මෙම ව්‍යවස්ථාවල සඳහන් නියමයන් පරිදි ක්‍රියා කිරීමේදී, නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ සේවකයකුට හෝ එකී ඉඩමකට ගෙන එන ලද කවර හෝ භාණ්ඩයකට හෝ යන්ත්‍රෝපකරණයකට හෝ වාහනයකට අවහිර කිරීම හෝ බාධා කිරීම හෝ අලාභ හානි කිරීම වරදක් වන්නේ ය.

48. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කවර හෝ උල්ලංඝනය කිරීමක් හෝ නොසලකා හැරීමක් හෝ පැහැර හැරීමක් පිළිබඳව නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් එවනු ලබන දැන්වීමක් ලැබූ සෑම තැනැත්තෙක් ම එකී දැන්වීමේ නියමකර ඇති දිනයට පෙර එහි නියමකර ඇති ආකාරයෙන් ක්‍රියා කළ යුතු ය.

49. යම් තැනැත්තකු විසින් 48 වන අතුරු ව්‍යවස්ථාව යටතේ වූ දැන්වීමක ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, සභාව විසින් එකී දැන්වීමේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතු අතර ඒ සඳහා සභාව විසින් දරන ලද සියලු වියදම් එකී දැන්වීම ලැබිය යුතු පුද්ගලයාගෙන් අයකර ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

50. 48 වන අතුරු ව්‍යවස්ථාව යටතේ තමා වෙත කරනු ලැබූ යම් දැන්වීමක නියමිත කාලය ඇතුලත ඒ දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ නොසලකා හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. තවද එකී වරද දෙවන වරට හෝ තදනන්තරව සිදු කරනු ලැබූ අවස්ථාවක රුපියල් දෙදහසක අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

51. මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් කිසියම් ලිඛිත දැන්වීමක්, එකී ඉඩමේ හෝ නිවසේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත අතින් භාර දීමෙන් හෝ එකී ස්ථානයේ අලවා තැබීමෙන් ම, එකී දැන්වීම නිවැරදි ආකාරයෙන් භාරදුන් බවට පිළිගනු ලබන්නේ ය.

52. මේ අතුරු ව්‍යවස්ථාවල තවර හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් වන උල්ලංඝනය කිරීමක් වරදක් වන අතර, එකී වරදක් සම්බන්ධයෙන් තිපි බලය ඇති අධිකරණයක් වෙතින් පළමුවන වරට වරදකරු කිරීමෙන් පසු රුපියල් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර දෙවන වර හෝ තදනන්තරව එකී වරද සඳහා වරදකරු කරනු ලබනවිට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. එසේම එකී උල්ලංඝනය කිරීමේ වරද දිගින් දිගටම කරගෙන යන අවස්ථාවක, තිපි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එකී උල්ලංඝනය කිරීමේ වරද කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ බලයලත් නිලධාරියා විසින් භාරකරනු ලැබීමෙන් පසුව හෝ එකී වරද තව දුරටත් කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පණහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට ද යටත් වන්නේ ය.

D.1-140

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාවල ;

"ජල මූලාශ්‍රය" යන්නෙන්, කිසියම් ගංගාවක්, ඇලක්, දොළක්, වැවක්, පොකුණක්, උල්පතක්, දිය අගලක්, දිය කඩිත්තක්, ජලාශයක්, කලපුවක් හෝ සාගරය ද,

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, . . . . . . . . . . . . මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා හෝ තත්කාලයේ නාගරික කොමසාරිස්වරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කරනු ලැබීමට පත් කරනු ලැබූ වෙනත් මිනැම අයෙක් ද,

"පොදු ස්ථානය" යන්නෙන්, කිසියම් ජල මූලාශ්‍රයක්, ජලාශයක්, ගංගාවක්, ඇලක්, දොළක්, දිය කඩිත්තක්, වෙනත් කිසියම් ජල මාර්ගයක්, මුහුද, ජල පෝෂිත ප්‍රදේශයක්, පොදු මංමාවතක්, පොදු කාණුවක් හෝ කිසියම් පොදු ඉඩමක් ද,

"බල ප්‍රදේශය" යන්නෙන්, . . . . . . . . . . . . මහා නගර සභාවේ සභාවේ බල ප්‍රදේශය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් වූ කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය ලැබ ඇති යම් තැනැත්තෙක් ද,

"භාරකරු" යන්නෙන්, කිසියම් පොදු වැසිකිළියක් හෝ පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් හෝ හිමිකරුගෙන් කුලියට හෝ බද්දට ලබාගෙන ඇති යම් තැනැත්තෙක් ද,

"මහා නගර සභාව" හෝ "සභාව" යන්නෙන්, . . . . . . . . . මහා නගර සභාව සභාව ද,

"වාහනය" යන්නෙන්, කිසියම් යන්ත්‍රෝපකරණයක් හෝ මෝටර් වාහන ලියා පදිංචි කිරීමේ ආඥා පනත යටතේ අර්ථ කථනය කර ඇති කිසියම් වාහනයක් ද,

"වැඩ පොළ" යන්නෙන්, කිසියම් වාහනයක ඇන්ජිම හෝ ඉන් කොටසක් හෝ වාහනයේ යම් කොටසක් හෝ උපාංගයක් හෝ අලුත්වැඩියා කරන හෝ අලුතින් සවිකරන ස්ථානයක් හෝ වාහනයක් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ පින්තාරු කරන ස්ථානයක් හෝ වාහනයක තහඩු පැස්සීම කරනු ලබන ස්ථානයක් හෝ වායු සමීකරණ අලුත්වැඩියා කරන හෝ අලුතින් සවිකරන ස්ථානයක් හෝ පාවිච්චි කළ වාහන හෝ යන්ත්‍රෝපකරණ අමතර කොටස් මුදලට විකිණීම හෝ රැස්කර තබා ගනු ලබන ස්ථානයක් හෝ කිසියම් ලියවන පට්ටලයක් හෝ පැස්සුම් වැඩ පොළක් හෝ පා පැදි අළුත්වැඩියා කරන ස්ථානයක් හෝ මෝටර් හෝ වෙනත් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් හෝ ටයර් හෝ ටියුබ් මාරු කරන හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් හෝ ටයර් හෝ ටියුබ් එක් රැස්කරන හෝ ගබඩා කර තබන ස්ථානයක් ද,

"සේවා ස්ථානය" යන්නෙන්, කිසියම් වාහනයක පිටත හෝ ඇතුළත සේදීමේ හෝ ඇන්ජිමේ, ගියර පෙට්ටියේ හෝ වෙනයම් උපාංගයක ලිහිසි තෙල් මාරු කිරීමේ හෝ පිරිසිදු කිරීමේ හෝ මේ පියලුම කාර්යයන් ඉටු කිරීමේ හෝ ඊට ආනුෂංගික කාර්යයන් හෝ ඉටු කරන ස්ථානයක් ද,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා" යන්නෙන්, . . . . . . . . . . . . මහා නගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ තත්කාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කරනු ලැබීමට නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලැබූ වෙනත් කවර වූ තැනැත්තෙක් ද,

"හිමිකරු හෝ පදිංචිකරු හෝ කළමනාකරු" යන්නෙන්, කිසියම් සේවා ස්ථානයක හෝ වැඩ පොළක නීත්‍යානුකූල හිමිකරු හෝ එකී ස්ථානයක හිමිකරු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන කිසියම් කළමනාකරුවකු හෝ ඒ අවස්ථාවේ එකී ස්ථානයේ කටයුතු භාරව සිටින කවර හෝ තැනැත්තකු ද,

අදහස් වේ.

D.1-141



## උප ලේඛන අංක 01

03 වන අතුරු ව්‍යවස්ථාවේ ( 1 ) අනුඡේදය

### පොදු වැසිකිළියක් ඉදිකර පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම

( ඉඩමේ ඔප්පුවේ හා පිඹුරුපතේ සහතිකකළ ඡායා පිටපතක් බැගින් සහ පොදු වැසිකිළිය අයත් ඉඩම අයදුම්කරුගේ නොවන විට, මේ කාර්යය සඳහා අයදුම්කරුට ඉඩම ලබාදීමට ඉඩම හිමිකරුගේ කැමැත්ත පළ කළ දිවුරුම් ප්‍රකාශයක් අයදුම්පත්‍රයට අමුණන්න )

01. අයදුම්කරුගේ නම : ............................................
02. ලිපිනය : ............................................
03. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ............................................
04. පොදු වැසිකිළිය ඉදිකිරීමට අපේක්ෂා කරන හෝ ඉදිකර ඇති ඉඩම සම්බන්ධ තොරතුරු ;
    i. ඉඩමේ නම : ............................................
    ii. ඉඩමේ පිහිටීම : ............................................
    iii. ඉඩමේ වට මායිම් පිළිබඳ විස්තරය ;
        උතුරට : ............................................
        දකුණට : ............................................
        නැගෙනහිරට : ............................................
        බස්නාහිරට : ............................................
05. ඉඩම හිමිකරුගේ නම : ............................................
06. ඉඩම හිමිකරු අයදුම්කරු නොවන විට ;
    i. ඉඩම හිමිකරුගේ ලිපිනය : ............................................
    ii. ඔහුගේ ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ............................................
07. ඉඩමේ පිඹුරු පතේ අංකය ( මිනින්දෝරු තැනගේ නම, හා දිනය සමග ) : ............................................
08. ඉඩමේ ඔප්පුවේ අංකය ( නොතාරිස්තැන ගේ නම හා දිනය සමග ) : ............................................
09. ඉදිකිරීමට අපේක්ෂිත / ඉදිකර ඇති පොදු වැසිකිළියේ ;
    i. වැසිකිළි කාමර සංඛ්‍යාව : පිරිමින්ට .....යි. ස්ත්‍රීන්ට .....යි.
    ii. කැසිකිළි පෝච්චි සංඛ්‍යාව : ........
    iii. භාවිත කරන්නන්ගේ බඩු බාහිරාදිය තාවකාලිකව තැන්පත් කිරීමට වෙන්කල ඉඩ ප්‍රමාණය වර්ග අඩි : ..............
10. පොදු වැසිකිළියේ කළමනාකරුගේ ;
    i. නම : ............................................
    ii. ලිපිනය : ............................................
    iii. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ............................................

11. පිරිසිදු කිරීමේ කාර්යයට යොදවා ඇති කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ;

| | නම | ස්ත්‍රී / පුරුෂ භාවය | ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය |
|---|---|---|---|
| i. | ............................... | ............ | ........................ |
| ii. | ............................... | ............ | ........................ |
| iii. | ............................... | ............ | ........................ |
| iv. | ............................... | ............ | ........................ |
| v. | ............................... | ............ | ........................ |

12. ගාස්තු ක්‍රමය ;

i. වැසිකිළිය පාවිච්චි කිරීමට එක් අයෙකුට වරකට රු. ............ බැගින්

ii. කැසිකිළිය පාවිච්චි කිරීමට එක් අයෙකුට වරකට රු. ............ බැගින්

13. ජලය ලබා ගන්නා ආකාරය : ...............................

14. ජල රැඳවුම් ටැංකියේ ධාරිතාව : ලීටර් ............

15. ............ මහා නගර සභාවේ වැසිකිළි, කාණු හා ලිං ඉදිකිරීම හා පවත්වාගෙනයාම සහ අප දියර බැහැර කිරීම විධිමත් කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමටත්, මේ අයදුම්පත්‍රයේ අංක 01 සිට 03 දක්වා සහ අංක 10 සිට 14 දක්වා ඡේදයන්හි තොරතුරුවල වෙනසක් ඇතිවූ විගසම ඒ බව නාගරික කොමසාරිස්වරයා වෙත දන්වා සිටීමටත් මෙයින් පොරොන්දු වෙමි. එසේම කලින් කල මහා නගර සභාව විසින් නියම කරනු ලබන සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමට එකඟ වන අතර මෙහි පහත අත්සන් කරන මා 05 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි පොදු වැසිකිළියේ හිමිකරුගේ හෝ භාරකරුගේ වගකීම දරන අය වශයෙන් ක්‍රියා කරන බව මෙහි පහත අත්සන් කිරීමෙන් ම පිළිගනිමි.

දිනය : ........................

අයදුම්කරුගේ අත්සන

D.1-142



# උප ලේඛන අංක 02

## 03 වන අතුරු ව්‍යවස්ථාවේ ( 1 ) අනුඡේදය

## පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් ඉදිකර පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම

( ඉඩමේ ඔප්පුවේ හා පිඹුරුපතේ සහතිකකළ ඡායා පිටපතක් බැගින් සහ පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ අයත් ඉඩම අයදුම්කරුගේ නොවන විට, මේ කාර්යය සඳහා අයදුම්කරුට ඉඩම ලබාදීමට ඉඩම හිමිකරුගේ කැමැත්ත පළ කළ දිවුරුම් ප්‍රකාශයක් අයදුම්පත්‍රයට අමුණන්න )

01. අයදුම්කරුගේ නම : ..........................................

02. ලිපිනය : ..........................................

03. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ..........................................

04. ඉදිකර පවත්වා ගැනීමට අදහස් කරන්නේ පොදු නාන ස්ථානයක් ද පොදු නාන ළිඳක් ද යන වග : ..............................

05. පොදු නාන ස්ථානය / නාන ළිඳ ඉදිකිරීමට අපේක්ෂා කරන හෝ ඉදිකර ඇති ඉඩම සම්බන්ධ තොරතුරු ;

i. ඉඩමේ නම : ..........................................

ii. ඉඩමේ පිහිටීම : ..........................................

iii. ඉඩමේ වට මායිම් පිළිබඳ විස්තරය ;

උතුරට : ....................................

දකුණට : ....................................

නැගෙනහිරට : ....................................

බස්නාහිරට : ....................................

06. ඉඩම හිමිකරුගේ නම : ..........................................

07. ඉඩම හිමිකරු අයදුම්කරු නොවන විට ;

i. ඉඩම හිමිකරුගේ ලිපිනය : ..................................

ii. ඔහුගේ ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ..................................

08. ඉඩමේ පිඹුරු පතේ අංකය ( මිනින්දෝරු තැන ගේ නම, හා දිනය සමග ) : ..................................

09. ඉඩමේ ඔප්පුවේ අංකය ( නොතාරිස්තැන ගේ නම හා දිනය සමග ) : ..................................

10. පොදු නාන ස්ථානයක් හෝ පොදු නාන ළිඳෙහි ඇති ;

නාන කාමර සංඛ්‍යාව : පිරිමින්ට .....යි. ස්ත්‍රීන්ට .....යි.

11. භාවිත කරන්නන්ගේ බඩු බාහිරාදිය තාවකාලිකව තැන්පත් කිරීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය වර්ග අඩි : ..............................

12. පොදු නාන ස්ථානයේ හෝ නාන ළිඳේ කළමනාකරුගේ ;

i. නම : ..........................................

ii. ලිපිනය : ..........................................

iii. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ..........................................

13. පිරිසිදු කිරීමේ කාර්යයට යොදවා ඇති කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ;

| | නම | ජති / පුරුෂ භාවය | ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය |
|---|---|---|---|
| i. | .............................. | ............ | ........................ |
| ii. | .............................. | ............ | ........................ |
| iii. | .............................. | ............ | ........................ |
| iv. | .............................. | ............ | ........................ |
| v. | .............................. | ............ | ........................ |

14. ගාස්තු ක්‍රමය ;

i. නැමට වැඩිහිටි එක් අයෙකුට වරකට රු. ............ බැගින්

ii. නැමට වයස අවුරුදු 12 ට අඩු ළමයෙකුට වරකට රු. ............ බැගින්

15. ජලය ලබා ගන්නා ආකාරය : ..............................

16. ජල රැඳවුම් ටැංකියේ ධාරිතාව : ලීටර් ............

17. ............ මහා නගර සභාවේ වැසිකිලි, කාණු හා ළිං ඉදිකිරීම හා පවත්වාගෙනයාම සහ අප දියර බැහැර කිරීම විධිමත් කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමටත්, මේ අයදුම්පත්‍රයේ අංක 01 සිට 03 දක්වා සහ අංක 12 සිට 16 දක්වා ඡේදයන්හි තොරතුරුවල වෙනසක් ඇතිවූ වහාම ඒ බව නාගරික කොමසාරිස්වරයා වෙත දන්වා සිටීමටත් මෙයින් පොරොන්දු වෙමි. එසේම කලින් කල මහා නගර සභාව විසින් නියම කරනු ලබන සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමටත් එකග වන අතර මෙහි පහත අත්සන් කරන මා 05 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි භාරකාරත්වයේ වගකීම දරන අය වශයෙන් ක්‍රියා කරන බව මෙහි පහත අත්සන් කිරීමෙන් ම පිළිගනිමි.

D.1-143

දිනය : ........................

අයදුම්කරුගේ අත්සන



උප ලේඛන අංක 03
03 වන අතුරු ව්‍යවස්ථාවේ ( 3 ) අනුඡේදය
" අ " ආකෘති පත්‍රය

## පොදු වැසිකිළියක් පවත්වාගෙන යාමට නිකුත් කරන බලපත්‍රය

ගෙවන ලද ගාස්තුව : රු. ............ බලපත්‍රයේ අනුක්‍රමික අංකය : ............

.................. හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක .................. දරන හැඳුනුම් පත්‍ර හිමිකරු වන ................................ යන අයට මෙහි පසු පිටෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව 20 .... දෙසැම්බර් මස 31 වන දින දක්වා වන කාලයට ............... මහා නගර සභා සීමාවේ ............................ යන ස්ථානයේ වැසිකිලි කාමර .... කින් හා නැසිකිලි කාමර .... කින් යුක්ත වූ පොදු වැසිකිලියක් පවත්වාගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ.

දිනය : ................

........................

නාගරික කොමසාරිස්

............ මහා නගර සභාව

( ආකෘතියේ පසුපිට )

01. පොදු වැසිකිලිය ඇතුලත හෝ ඉන් පිටත පරිශ්‍රය තුල කිසිදු අවිධිමත් ක්‍රියාවකට ඉඩ නොතැබිය යුතු ය.

02. පොදු වැසිකිලිය භාවිත කරන්නන්ගේ පෞද්ගලිකත්වයට හානි දායක වන කිසිදු ක්‍රියාවක් හෝ චාවනයක් නොකළ යුතු ය.

03. වැසිකිලියේ පරිහරණය සඳහා තබා ගනු ලබන ද්‍රව්‍ය හෝ භාණ්ඩ හෝ භාවිත කරන්නකු විසින් ඒ අවස්ථාවේ තාවකාලිකව තැන්පත් කරන අත්‍යාවශ්‍යතාව සහවූරු කරගත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ හැර වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් වැසිකිලිය ඇතුලත හෝ එහි පරිශ්‍රය ඇතුලත තබා නොගත යුතු ය.

04. පොදු වැසිකිලිය ඇතුලත හෝ පරිශ්‍රය තුල කවර වේලාවක ගිනි දැල්වීම නොකළ යුතු ය.

05. පොදු වැසිකිලිය වසා තැබීමට නියමිත වේලාවෙන් පසුව හා නැවත විවෘත කරන වේලාවට පෙර නාගරික කොමසාරිස්ගෙන් විධිමත් අවසරයක් නොමැතිව රැඳී සිටීම නොකළ යුතු අතර එකී වේලාවන් අතර ඒ ඇතුලත හෝ පරිශ්‍රයේ ඇතුලත තබා යන කවර හෝ ද්‍රව්‍ය හෝ භාණ්ඩ යමක් පිළිබඳ අවදානම බලපත්‍රය දරන්නාගේ වගකීම වන්නේ ය.

06. භාවිත කරන්නන්ගෙන් අයකිරීමට නියම කර ගෙන, මහා නගර සභාවට පූර්ව දැන්වීමක් මගින් වාර්තා කර ඇති ගාස්තුවට වඩා වැඩිපුර කිසිදු ගාස්තුවක් අය නොකළ යුතු ය.

07. මේ කොන්දේසි කඩ කිරීම, අතුරු ව්‍යවස්ථා යටතේවන වෙනත් දණ්ඩනයකට අතිරේකව, මේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට හේතු විය හැකි ය.

D.1-144

## උප ලේඛන අංක 03

03 වන අතුරු ව්‍යවස්ථාවේ ( 3 ) අනුජේදය

" ආ " ආකෘති පත්‍රය

### පොදු පොදු නාන ස්ථානයක් හෝ නාන ළිඳක් පවත්වාගෙන යාමට නිකුත් කරන බලපත්‍රය

ගෙවන ලද ගාස්තුව : රු. . . . . . . . . . . .                    බලපත්‍රයේ අනුක්‍රමික අංකය : . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක . . . . . . . . . . . . . . . . . . . දරන හැඳුනුම් පත්‍ර හිමිකරු වන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . යන අයට මෙහි පසුපිටෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව 20 . . . . දෙසැම්බර් මස 31 වන දින දක්වා වන කාලයට . . . . . . . . . . . . . . . මහා නගර සභා සීමාවේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . යන ස්ථානයේ නාන කාමර . . . . සිත් යුක්ත වූ පොදු නාන ස්ථානයක් / නාන ළිඳක් පවත්වාගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ.

දිනය : . . . . . . . . . . . . . . .                    . . . . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික කොමසාරිස්

. . . . . . . . . . . . මහා නගර සභාව

( ආකෘතියේ පසුපිට )

01. පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ ඇතුලත හෝ ඉන් පිටත පරිශ්‍රය තුල කිසිදු අවිධිමත් ක්‍රියාවකට ඉඩ නොතැබිය යුතු ය.

02. පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ භාවිත කරන්නන්ගේ පෞද්ගලිකත්වයට හානි දායක වන කිසිදු ක්‍රියාවක් හෝ වාචකයක් නොකළ යුතු ය.

03. පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ පරිහරණය සඳහා තබා ගනු ලබන ද්‍රව්‍ය හෝ භාණ්ඩ හෝ භාවිත කරන්නනු විසින් ඒ අවස්ථාවේ තාවකාලිකව තැන්පත් කරන අනන්‍යතාව තහවුරු කරගත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ හැර වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ ඇතුලත හෝ එහි පරිශ්‍රය ඇතුලත තබා නොගත යුතු ය.

04. පොදු නාන ස්ථානය හෝ නාන ළිඳ වසා තැබීමට නියමිත වේලාවෙන් පසුව හා නැවත විවෘත කරන වේලාවට පෙර නාගරික කොමසාරිස්ගෙන් විධිමත් අවසරයක් නොමැතිව රැඳී සිටීම නොකළ යුතු අතර එකී වේලාවන් අතර ඒ ඇතුලත හෝ පරිශ්‍රයේ ඇතුලත තබා යන කවර හෝ ද්‍රව්‍ය හෝ භාණ්ඩ යමක් පිළිබඳ අවදානම බලපත්‍රය දරන්නාගේ වගකීම වන්නේ ය.

05. භාවිත කරන්නන්ගෙන් අයකිරීමට නියම කර ගෙන, මහා නගර සභාවට පූර්ව දැන්වීමක් මගින් වාර්තා කර ඇති ගාස්තුවට වඩා වැඩිපුර කිසිදු ගාස්තුවක් අය නොකළ යුතු ය.

06. මෙ කොන්දේසි කඩ කිරීම, අතුරු ව්‍යවස්ථා යටතේවන වෙනත් දණ්ඩනයකට අතිරේකව, මේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට හේතු විය හැකි ය.

## උප ලේඛන අංක 04

05 වන අතුරු ව්‍යවස්ථාව

### පොදු වැසිකිළි, පොදු නාන ස්ථාන හා පොදු නාන ළිං පිළිබඳ තොරතුරු ලේඛනය

| අනු අංකය | වැසිකිළිය, නාන ස්ථානය හෝ නාන ළිඳ යන බව | ලිපිනය | වෙන්වූ කාමර ගනන | | | විවෘත කරන වේලාව | | එක් අනෙකුව ගාස්තුව රුපියල් හා ශත | | | | හිමිකරු හෝ භාරකරුගේ | | | කළමනාකරුගේ | | | පවිත්‍ර කරන්නන් ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පිරිමි | වැසිකිළි | සිට | දක්වා | පොදු වැසිකිළි | | නාන ස්ථාන | | නම | ජා. හැ. ප. අංකය | ලිපිනය | නම | ජා. හැ. ප. අංකය | ලිපිනය | ස්ත්‍රී | පුරුෂ |
| | | | | | | | | වැසිකිළිය | කැසිපිලිය | වැඩිහිටි | ළමයා | | | | | | | | |
| 01. | | | | | | | | | | | | | | | | | | | |
| 02. | | | | | | | | | | | | | | | | | | | |
| 03. | | | | | | | | | | | | | | | | | | | |
| 04. | | | | | | | | | | | | | | | | | | | |
| 05. | | | | | | | | | | | | | | | | | | | |

( සැ. යු. :- ලේඛනයේ වම් පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට හිරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය. )

D.1-145

# ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි සහ ප්‍රචාරක දැන්වීම් යොදා ගැනීම, විධිමත් කිරීම, අධීක්ෂණය, පාලනය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

## ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි කිරීම සහ ප්‍රචාරක දැන්වීම් යොදා ගැනීම විධිමත් කිරීම, අධීක්ෂණය, පාලනය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

01. මෙම අතුරු ව්‍යවස්ථාව, මහා නගර සභා සීමාව තුළ ඇති ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි කිරීම සහ ප්‍රචාරක දැන්වීම් යොදා ගැනීම විධිමත් කිරීම, අධීක්ෂණය, පාලනය හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. තත් කාර්යය සඳහා මේ අතුරු ව්‍යවස්ථා යටතේ නාගරික කොමසාරිස්වරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව මහා නගර සභා සීමාව තුළ කවරකු විසින් හෝ ප්‍රසිද්ධ ස්ථානයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතු අතර ප්‍රසිද්ධ ස්ථානයක කවර අන්දමේ හෝ සැරසිල්ලක් නොකළ යුතු ය.

03. වෙනත් ලිඛිත නීතියක විධිවිධාන වලට පටහැනි නොවන ආකාරයට සභා බල ප්‍රදේශය ඇතුලත ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ස්ථාන පිහිටුවා පවත්වාගෙනයාම සභාව විසින් කළ යුතු ය.

04. 02 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියේ පරිදි ඉල්ලුම්පත්‍රයක්, අවසර පත්‍රය අවශ්‍ය වේලාවට පැය හතලිස් අටකට පෙර නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. නාගරික කොමසාරිස්වරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයක් සඳහා නිකුත් කළ යුතුවන බලපත්‍රය, දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව එය අවශ්‍යකරන වේලාවට කලින් පිළියෙල කර ගත යුතු ය. බලපත්‍රලාභියා විසින් එකී බලපත්‍රයේ සඳහන් කොන්දේසිද පිළිපැදිය යුතු ය.

05. සෑම ඉල්ලුම්පත්‍රයක් සමගම ප්‍රචාරක දැන්වීමේ පිටපතක් ද, සැරසිල්ලක් පිළිබඳව වනවිට ඒ සැරසිල්ලේ විස්තරයක් ද ඉදිරිපත් කළ යුතු ය.

06. සෑම බලපත්‍රයක් සඳහාම තුන්වන උපලේඛනයේ සඳහන් වන අවස්ථාවක් පිළිබඳව අදාල වන පරිදි සභාව විසින් කලින් කළ තීරණය කරන පරිදි වන ගාස්තුවක් ගෙවිය යුතු අතර නාගරික කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්පත්‍රය අනුමත කිරීමෙන් පසුව මෙකී මුදල ගෙවිය යුතු ය.

07. කවර හෝ අන්දමේ ප්‍රචාරක දැන්වීමක, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා නිකුත් කළ අවසර පත්‍රයේ අනුක්‍රමික අංකය එකී ප්‍රචාරක දැන්වීම ස්ථානගත කිරීමට මත්තෙන් අයදුම්කරු විසින් සඳහන් කර තිබිය යුතු ය.

08. නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන මුදලක් සෑම සැරසිල්ලක් හෝ ප්‍රචාරක දැන්වීමක් සඳහාම ඇප මුදලක් වශයෙන් සභාවේ තැන්පත් කළ යුතු ය.

09. 08 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ඇප මුදල, බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩ කිරීමක් හේතුවෙන් මහා නගර සභාව විසින් ක්‍රියා කිරීම වෙනුවෙන් වැයවන මුදල සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් පියවා ගැනීම සඳහා යොදා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. එකී මුදල පියවා ගැනීමට ඇප මුදල ප්‍රමාණවත් නොවන විට, තව දුරටත් පවතින හිඟය බලපත්‍රධාරියා විසින් සභාවට ගෙවිය යුතු ය. කෙසේ වුවද පියවාගත යුතු එකී මුදල ගනන් බලන ලද ආකාරය බලපත්‍රලාභියා වෙත සභාව විසින් දැනුම් දිය යුතු ය.

10. පහත සඳහන් අවස්ථාවක හෝ අවස්ථාවල දී කරනු ලබන ඉල්ලීමක් හෝ ඉල්ලීම් වෙනුවෙන්, මේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

(i) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හෝ සැරසිලි කිරීම නොකළ යුතු යයි සභාව විසින් තීරණය කර ඇති ස්ථානයක එකී කාර්යයක් කිරීමට බලපත්‍රයක් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම,

(ii) මහා නගර සභාව විසින් වෙන්කර ඇති ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ස්ථානයක ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති අවස්ථාවක, එකී ප්‍රදර්ශන ස්ථානයේ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම,

(iii) කවර හෝ සැරසිල්ලක් හෝ ප්‍රචාරක දැන්වීමක් හේතුවෙන් සංස්කෘතික, සදාචාරාත්මක, ආගමික හෝ පාරිසරික හානියක් සිදුවිය හැකි බවට නාගරික කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබ ඇති විටක, එවැනි සැරසිල්ලක් කිරීමට හෝ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම, සහ

(iv) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති සැරසිලි හෝ ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීමක්.

11. ප්‍රදර්ශනය සඳහා විධිමත් බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන දැන්වීම්, එකී අවසරයේ සඳහන් කාල සීමාව ඇතුළත දී ඒවාට සිදුවන කිසියම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමක් සම්බන්ධයෙන් සභාව කිසිදු වගකීමකට යටත් නොවිය යුතු ය.

12. ලබා දී ඇති බලපත්‍රයක් සාධාරන හේතු මත නාගරික කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි අවලංගු කිරීම කළ හැකි ය.

13. ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක් සඳහා යොදා ගනු ලබන කවර අන්දමේ හෝ ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවිකිරීමක් අන්තරාදායක හෝ අප්‍රසන්න දර්ශනයක් ලෙස පවතින අවස්ථාවක එය නියමිත කාලයක් ඇතුළත යථා තත්වයට පත්කරන ලෙස නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියකු විසින් බලපත්‍රධාරියාට නියම කළ හැකි ය. එකී නියමයේ සඳහන් කාලය තුළ එකී විධිවිධාන පිළිපැදීම පැහැර හරින විටක දී, සභාවේ වියදමින් එකී කාර්යය ඉටු කරවා ඒ සඳහා දරන ලද සියළු වියදම් බලපත්‍රධාරියා විසින් සභාවේ තැන්පත් කරන ලද ඇප මුදලින් පියවා ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

14. යම් ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක් වෙනුවෙන් ලබා දෙන අවසරපත්‍රයක් මත, එකී ප්‍රචාරක දැන්වීමේ හෝ සැරසිල්ලේ දැක්වෙන අර්ථය හෝ ප්‍රකාශිතය වෙනුවෙන් දෙනු ලැබූ නිතිමය අවසරයක් ලෙස අවබෝධකර නොගත යුතු ය.

15. යම් ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක් ඉදිකිරීමේ දී හෝ සවිකිරීමේ දී යොදා ගනු ලබන යම් යම් ආධාරකයක්, සවිකිරීමක්, ඉදිකිරීමක්, වෙනත් යම් දෙයක් හේතුවෙන් හෝ හෝ එකී ප්‍රචාරක දැන්වීමේ හෝ සැරසිල්ලේ දැක්වෙන අර්ථය හෝ ප්‍රකාශිතය හේතුවෙන් කවර හෝ පාර්ශවයකට සිදුවන අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය.

D.1-146



16. සැරසිලි කිරීම හෝ ප්‍රචාරක දැන්වීම් සඳහා භාවිත කළ ද්‍රව්‍ය වලින් ඉතිරිවන කොටස් හා අප ද්‍රව්‍ය හැකිතාක් ඉක්මනින් හා සැරසිල්ල හෝ ප්‍රචාරක දැන්වීම ස්ථානගත කර අවසන් වීමට මත්තෙන් එකී ස්ථාන වලින් ඉවත් කළ යුතු ය.

17. සභාවෙන් විධිමත් වූ අවසර පත්‍රයක් ලබාගෙන සැරසිලි හෝ ප්‍රචාරක දැන්වීම් ස්ථානගත කරනු ලබන සැම තැනැත්තකු ම, එකී අවසරපත්‍රය ලබා ගැනීමට ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද සැරසිල්ල හෝ ප්‍රචාරක දැන්වීම පවත්වාගෙන යනු ලබන අවසාන දිනයේ නියමිත වේලාවෙන් පසුව පැය හතලිස් අටක් ගත වීමට මත්තෙන් එකී සැරසිලි හෝ ප්‍රචාරක දැන්වීම් හා ඒට යොදාගත් වෙනත් සියළු ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කළ යුතු ය.

18. පෞද්ගලික ඉඩමක හෝ ගොඩනැගිල්ලක කරනු ලබන සැරසිලි හෝ ප්‍රචාරක දැන්වීම් සඳහා මේ අතුරු ව්‍යවස්ථා යටතේ අවසරපත්‍රයක් අවශ්‍ය නොවිය යුතු ය. එසේ වුවද එකී සැරසිලි හෝ ප්‍රචාරක දැන්වීම් සඳහා යොදාගත් ද්‍රව්‍ය හෝ ඉතිරිවන කොටස් සභාව විසින් වෙන්කරන ලද කසල බැහැරලීමේ ස්ථානයකට හෝ වෙනයම් ප්‍රසිද්ධ ස්ථානයකට නොදැමිය යුතු ය. එකී අපද්‍රව්‍ය, සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීම පිණිස නියමිතව නියම කර වෙන් කර දෙන ලද ස්ථානයකට බැහැර කිරීමට කවරකුට හෝ අවශ්‍ය වන්නේ නම් නාගරික කොමසාරිස්වරයා ගෙන් ඊට පූර්ව අවසරයක් ලබා ගත යුතු වාත් හැර ඒ සඳහා සභාව විසින් කලින් කළ නියම කරනු ලබන ගාස්තුවක් සභාවට ගෙවිය යුතු ය.

19. මහා නගර සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය සහ ලිපිනය පමණක් ප්‍රදර්ශනය වන එක් නාම පුවරුවක් පමණක් ගාස්තු වලින් නිදහස් වන්නේ ය.

20. සභාව විසින් සංවිධානය කරනු ලබන හෝ මහා නගර සභාවේ දායකත්වය ද සමග වෙනත් ආයතනයක් විසින් සංවිධානය කරනු ලබන කිසියම් උත්සවයකට හෝ සංදර්ශනයකට හෝ අවස්ථාවකට යොදා ගනු ලබන සැරසිලි වෙනුවෙන් පොලිතින් හෝ පොලිතින් ආශ්‍රිත නිශ්පාදන හෝ දිරාපත් නොවන වෙනත් ද්‍රව්‍යයක් යොදා නොගත යුතු ය.

21. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක්, පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කොටසකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රක්ෂේපනය කිරීම කවරකු විසින් හෝ නොකළ යුතු ය.

22. මේ අතුරු ව්‍යවස්ථා යටතේ කලින් ලබා ගත් විධිමත් බලපත්‍රයක් ඇත්තේ වුවද, එකී බලපත්‍රයේ නියමිතව සඳහන් කළ ස්ථානයේ හෝ ස්ථානවල හැර, වෙනත් කවර හෝ ස්ථානයක හෝ කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක් හෝ ස්ථානගත කිරීම කිසිවකු විසින් නොකළ යුතු ය.

23. මේ අතුරු ව්‍යවස්ථා යටතේ කලින් ලබා ගත් විධිමත් අවසරපත්‍රයක් නොමැතිව හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කොන්දේසි හෝ බලපත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය වන ආකාරයෙන් සැරසිලි හෝ ප්‍රචාරක දැන්වීම් භාවිත කරනු ලබන කිසියම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

24. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සභාව විසින් අයකිරීමට කලින් කල තීරණය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ නිවේදනයක් නාගරික කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

25. නාගරික කොමසාරිස්වරයා විසින් මේ අතුරු ව්‍යවස්ථාවල බලතල හා කාර්යයන් සභාවේ කිසියම් නිලධාරියකුට ලියවිල්ලකින් කරනු ලබන නියමයක් මගින් පවරා දිය හැකි ය.

26. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් වන උල්ලංඝනය කිරීමක් වරදක් වන අතර, එකී වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් වෙතින් පළමුවන වරට වරදකරු කිරීමෙන් පසු රුපියල් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර දෙවන වර හෝ තදනන්තරව එකී වරද සඳහා වරදකරු කරනු ලබනවිට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. එසේම එකී උල්ලංඝනය කිරීමේ වරද දිගින් දිගටම කරගෙන යන අවස්ථාවක, නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එකී උල්ලංඝනය කිරීමේ වරද කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ බලයලත් නිලධාරියා විසින් භාරකරනු ලැබීමෙන් පසුව හෝ එකී වරද තව දුරටත් කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පණහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට ද යටත් වන්නේ ය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාවල ;

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, . . . . . . . . . . . . මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා හෝ තත්කාලයේ නාගරික කොමසාරිස්වරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කරනු ලැබීමට පත් කරනු ලැබූ වෙනත් ඕනෑම අයෙක් ද,

"ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, කවර හෝ තැනැත්තකු විසින්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරන ප්‍රචාරක දැන්වීමක් හෝ පෝස්ටරයක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ වෙනත් යම් ආකාරයක දැන්වීමක් හෝ උපයෝගී කරගෙන ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් වූ දැන්වීමක්, නිවේදනයක් හෝ වෙළෙඳ දැන්වීමක් ද,

"ප්‍රදර්ශන ස්ථානය" යන්නෙන්, මහා නගර සභාව විසින් සභා සම්මුතියක් මගින් තීරණය කරනු ලබන ස්ථානයක හෝ ස්ථානවල, ඉදිකර පවත්වාගෙන යනු ලබන ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර්, බැනර් හා කටවුට් ප්‍රදර්ශනය කළ හැකි ස්ථානයක් ද,

"ප්‍රසිද්ධ ස්ථානය" යන්නෙන්, සභා බල ප්‍රදේශය ඇතුළත වූ කිසියම් මාර්ගයක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම් පොළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇළක්, දොළක්, වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්, දිය පහරක්, මුහුදු වෙරළක් හෝ මහජනතාවගේ පොදු පරිහරණයට ලක්වන වෙනත් ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක් ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් වූ කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබ ඇති යම් පුද්ගලයකු ද,

D.1-147



"ස්ථානගත කිරීම" යන්නෙන්, මහජනයාගේ අවධානයට ලක්වන පරිදි කිසියම් ප්‍රචාරක දැන්වීම් පුවරුවක්, පෝස්ටරයක්, බැනරයක්, කටවුට් එකක්, වෙනත් යම් ආකාරයක දැන්වීමක්, සැරසිල්ලක්, පතාක් වැටක් හෝ සවිකිරීම, ඉදිකිරීම, අලවා තැබීම, එල්ලා තැබීම හෝ කිසියම් පෙළපාළියක හෝ රැස්වීමක හෝ ප්‍රදර්ශනය කරමින් රැගෙනයාම හෝ කවර ආකාරයේ හෝ තොරණක් නිර්මාණය කර ප්‍රදර්ශනය කිරීම ද,

"සභාව" යන්නෙන්, . . . . . . . . . . . . . . . . මහා නගර සභාව ද,

"සැරසිල්ල" යන්නෙන්, ආගමික හෝ සංස්කෘතික උත්සවයක්, අවමංගල්‍ය උත්සවයක්, රැස්වීමක්, රැලියක්, සම්මන්ත්‍රණයක්, පෙළපාළියක්, පෙරහැරක්, අනුස්මරණ උත්සවයක් හෝ පුද්ගල කණ්ඩායමක් එක්ව සිදුකරන කිසියම් ක්‍රියාකාර කමකදී කවර හෝ ස්ථානයක හෝ ස්ථාන වැඩි ගණනක එකී කාර්යය හුවා දැක්වීමට හෝ අලංකාර කිරීමට කරනු ලබන සැරසිල්ලක් ප්‍රචාරක දැන්වීමක් හෝ ඉදිකරන තොරණ හෝ කොඩි හෝ පතාක් වැටක් ද,

අදහස් වේ.

## පළමුවන උප ලේඛනය

04 වන අතුරු ව්‍යවස්ථාව

### ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම / ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි කිරීම සඳහා අයදුම් පත්‍රය

01. අයදුම්කරුගේ නම :
02. ලිපිනය :
03. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :
04. දුරකථන අංකය :
05. ප්‍රචාරක දැන්වීමේ විස්තර ;
    - i. දැන්වීමේ ප්‍රමාණය : දිග : සෙ. මී. . . . . . . . . පළල : සෙ. මී. . . . . . . .
    - ii. දැන්වීම් සංඛ්‍යාව :
    - iii. ස්වභාවය :
    - iv. දැන්වීමේ අන්තර්ගත වන දේ :
    - v. ස්ථානගත කරන අන්දම :
    - vi. ස්ථානගත කරන ස්ථානයන් :

    ( ප්‍රචාරක දැන්වීමේ සියළු අකුරු, චිත්‍ර හා වර්ණ ඒ ආකාරයෙන් ම පවතින දැන්වීමේ ආදර්ශයක් යාකර තිබිය යුතු ය. )
06. සැරසිලි පිළිබඳ විස්තර හා භාවිත කරන වර්ග ;
    - i. පොලිතින් හෝ දිරාපත් නොවන රෙදි හෝ වෙනත් : ඔව් / නැත
      දෑ භාවිත කරනු ලබන්නේ ද ?
    - ii. කපු රෙදි හෝ දිරාපත් වන ද්‍රව්‍ය හෝ එවැනි : ඔව් / නැත
      වෙනත් ද්‍රව්‍ය භාවිත කරනු ලබන්නේ ද ?
    - iii. පොලිතින් හෝ දිරාපත් නොවන රෙදි සහ දිරාපත් : ඔව් / නැත
      වන ද්‍රව්‍ය මිශ්‍ර වශයෙන් භාවිත කරනු ලබන්නේ ද ?
07. ඉල්ලා සිටින අවසර පත්‍රය වලංගු විය යුතු කාල සීමාව ;

    ආරම්භක දිනය 20 . . . . . . . . . . . මස . . . . දින වේලාව පෙ. ව./ප. ව. . . . . . . සිට

    අවසන්වන දිනය 20 . . . . . . . . . . . මස . . . . දින වේලාව පෙ. ව./ප. ව. . . . . . . දක්වා

ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි කිරීම සහ ප්‍රචාරක දැන්වීම් යොදා ගැනීම විධිමත් කිරීම, අධීක්ෂණය, පාලනය හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරුණු, එකී කාර්යයන්ට අදාල වෙනත් නීති හා බලපත්‍රයේ සඳහන් කොන්දේසි සියල්ලම පිළිපදින බවටත්, බලපත්‍රය වලංගු කාලය අවසන්වී පැය හතලිස් අටක් ගතවීමට මත්තෙන් බලපත්‍රයට අදාල ප්‍රචාරක දැන්වීම් / සැරසිලි හා ඊට යොදා ගෙන ඇති සියළු ද්‍රව්‍යයන් මාගේ වියදමින් එකී ස්ථාන වලින් ඉවත් කිරීමටත් මෙයින් පොරොන්දු වෙමි.

දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . .

අයදුම්කරුගේ අත්සන

D.1-148



## දෙවන උප ලේඛනය

04 වන අතුරු ව්‍යවස්ථාව

### . . . . . . . . . . . . මහා නගර සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් / සැරසිලි ස්ථානගත කිරීම සඳහා නිකුත් කරන බලපත්‍රය

ගෙවන ලද බලපත්‍ර ගාස්තුව : රු. . . . . . . . . . . . . බලපත්‍රයේ අනුක්‍රමික අංකය : . . . . . . . . . . .

ඇප මුදල : රු. . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක . . . . . . . . . . . . . . . . . දරන හැඳුනුම් පත්‍ර හිමිකරු වන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . යන අයට, ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි කිරීම සහ ප්‍රචාරක දැන්වීම් යොදා ගැනීම විධිමත් කිරීම, අධීක්ෂණය, පාලනය හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට සහ මෙහි පසු පිටෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව 20 . . . . . . . . . . . . . . . . මස . . . . . . . . වන දින පෙරවරු / පස්වරු . . . . . . . . සිට 20 . . . . . . . . . . . . . . . . මස . . . . . . . . . වන දින පෙරවරු / පස්වරු . . . . . . . . දක්වා වන කාලය ඇතුලත . . . . . . . . . . . . . . . මහා නගර සභා සීමාවේ පහත සඳහන් ස්ථානයේ / ස්ථානවල ප්‍රචාරක දැන්වීම් / සැරසිලි ස්ථානගත කිරීමට මෙයින් අවසර දෙනු ලැබේ.

ප්‍රචාරක දැන්වීම් / සැරසිලි ස්ථානගත කිරීමට බලය ලබා දී ඇති ස්ථානය / ස්ථාන

01. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
02. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
03. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
04. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
05. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය : . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික කොමසාරිස්

. . . . . . . . . . . . . මහා නගර සභාව

( ආකෘතියේ පසුපිට )

01. ප්‍රචාරක දැන්වීම් හෝ සැරසිලි ස්ථානගත කිරීමේදී ඉතිරිවන ද්‍රව්‍ය සියල්ලම වහාම එකී ස්ථාන වලින් ඉවත් කල යුතු ය.
02. කිසියම් ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක් ස්ථානගත කිරීමේ අවස්ථාවේදී එකී ස්ථානයෙන් ගමන් ගන්නා වාහන වලට හෝ මහජනතාවට හෝ මහජන දේපලකට බාධාවක් හෝ පීඩාවක් නොවන පරිදි එකී කාර්යය කල යුතු ය.
03. කිසිදු සැරසිල්ලක් හෝ ප්‍රචාරක දැන්වීමක් හේතුවෙන් ඊට ආසන්නයේ ඇති විදුලි රැහැන් වලට හෝ දුරකථන රැහැන් වලට හානි නොවන ආකාරයෙන් ස්ථානගත කල යුතු ය.
04. කිසියම් ප්‍රචාරක දැන්වීමක් හෝ සැරසිල්ලක් ස්ථානගත කිරීමේදී පොදු විදුලි හෝ පොදු දුරකථන සැපයුම් මාර්ගයකට හානියක් හෝ බාධාවක් නොවන ආකාරයට ක්‍රියාකල යුතු අතර එකී සැරසිල්ල හෝ ප්‍රචාරක දැන්වීම අලංකාර කිරීමට හෝ වෙනත් කාර්යයකට විධිමත් අවසරයකින් තොරව පොදු විදුලි සැපයුමකින් විදුලිය ලබා නොගත යුතු ය.

D.1-149

## තුන්වන උප ලේඛනය

06 වන අතුරු ව්‍යවස්ථාව

### ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය / ප්‍රසිද්ධ ස්ථානවල සැරසිලි කිරීම සඳහා ගාස්තු උපලේඛනය

පහත සඳහන් ගාස්තු ප්‍රමාණවල උපරිමයන්ට යටත්ව සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවක් අයකරනු ලැබිය හැකිය.

1. ප්‍රචාරක දැන්වීම්

| | දැන්වීම් වර්ගය | | දැන්වීම / දැන්වීම් පිලියෙල කිරීමට භාවිත කරන ද්‍රව්‍ය හෝ ද්‍රව්‍යයන් | කාල සීමාව හා වර්ග මීටරයකට ගාස්තුව - රු. | | |
|---|---|---|---|---|---|---|
| | | | | මාසයක් දක්වා | මාස 01 ට වැඩි මාස 03 දක්වා | මාස 03 ට වැඩි මාස 12 දක්වා |
| i. | දැන්වීම් පුවරු | | පිලියෙල කිරීමට භාවිත කල ද්‍රව්‍ය කුමක් වුවද | | | |
| ii. | බැනර් | අ. | පොලිතීන් හෝ දිරාපත් නොවන ද්‍රව්‍ය | | | |
| | | ආ. | දිරාපත් වන ද්‍රව්‍ය | | | |
| iii. | කටවුට්ස් | අ. | පොලිතීන් හෝ දිරාපත් නොවන ද්‍රව්‍ය | | | |
| | | ආ. | දිරාපත් වන ද්‍රව්‍ය | | | |
| iv. | පෝස්ටර් * | අ. | පොලිතීන් හෝ දිරාපත් නොවන ද්‍රව්‍ය | | | ** |
| | | ආ. | දිරාපත් වන ද්‍රව්‍ය | | | ** |
| v. | කුඩා දැන්වීම් * | අ. | පොලිතීන් හෝ දිරාපත් නොවන ද්‍රව්‍ය | | | ** |
| | | ආ. | දිරාපත් වන ද්‍රව්‍ය | | | ** |

* - ප්‍රදර්ශනය කරනු ලබන මුළු පෝස්ටර් ප්‍රමාණයට අදාල වර්ග ඵලය මත ගනන් බැලිය යුතු ය.

** - මාස දෙකකට වඩා වැඩි කාලයකට අවසරපත්‍ර නිකුත් නොකල යුතු ය.

2. සැරසිලි

| | සැරසිලි කිරීමට භාවිත කරන ද්‍රව්‍ය | දිනකට ගාස්තුව රු. |
|---|---|---|
| අ. | දිරාපත් නොවන ද්‍රව්‍ය ( උදා :- පොලිතීන් ) *** | |
| ආ. | දිරාපත් වන ද්‍රව්‍ය *** | |

*** - කිසියම් එක් සැරසිල්ලක් සඳහා අවසර දෙනු ලැබිය යුත්තේ සතියක කාලයකට පමණි.

3. නිදහස් කිරීම්

ආගමික උත්සවයක හෝ අවමංගල්‍ය උත්සවයක සැරසිලි බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් වේ.



# අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව

# මහා නගර සභා බල ප්‍රදේශය ඇතුලත ඇති අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව.

01. මේ අතුරු ව්‍යවස්ථාව, මහා නගර සභා බල ප්‍රදේශය ඇතුලත ඇති අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම මහා නගර සභා ආඥා පනතේ 147 වන වගන්තියේ කාර්යය සඳහා අප්‍රසන්න ව්‍යාපාරයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

03. (1) මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව පිළියෙල කළ අයදුම්පත්‍රයක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත්කර ලබාගත් බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කිසියම් තැනැත්තකු විසින් බල ප්‍රදේශය ඇතුලත අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නීත්‍යානුකූල නොවන්නේ ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක් ම, කොමසාරිස්වරයා විසින් මේ අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින අවසන් විය යුතු අතර එකී බලපත්‍රය අන් අයකුට පැවරිය නොහැකි විය යුතු ය.

D.1-150

04. සභා බල ප්‍රදේශය ඇතුලත පවත්වාගෙන යනු ලබන අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අයකළ හැකි අතර එකී ගාස්තු ප්‍රමාණය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

05. කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක හිමිකරු විසින් මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් නියමයක් හෝ නියමයන් පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කළ විට, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යාමට නිකුත් කළ බලපත්‍රය කොමසාරිස් වරයා විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

06. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුලත මෘත දේහ සැකසීම පිණිස වෙන්වූ කාමරයක් තිබිය යුතු අතර එකී කාමරයේ එක් පුද්ගලයකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග අඩි අසූවකට නොඅඩු ඉඩ කඩක් තිබිය යුතු ය. එසේම එකී කාර්යය කිරීමට භාවිත කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතුවන අතර එය පිගන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතු ය.

07. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිත කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට වූ වාතයට විවෘත වන කවුළු සකසා තිබිය යුතු අතර ඒ පිළිබඳ කාර්යයන්හි නියුක්තවීම කිසිදු බාහිර පුද්ගලයකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතු ය. එකී කවුළු අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම් වල ඇති නිවාස දෙසට එන එල්ලේ විවෘත නොවී තිබිය යුතු ය.





08. මෘත දේහයක් සැකසීම කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු අතර එකී කාර්යය කරන අවස්ථාවේදී මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ භාජන තබා තිබිය යුතු ය. එකී භාජන අපාරගම්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ඒවා විය යුතු ය.

09. මෘත දේහයක් සැකසීමේදී ඉවත්කරනු ලබන හෝ ඉවත්වන මෘත ශරීර කොටස්, මහේස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු හෝ විසින් ඒ පිළිබඳව ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගතවීමට මත්තෙන් පොළොවේ මතුපිට සිට අඩි හතරක් ගැඹුරු වළක වල දමා මැනවින් වසා දැමිය යුතු ය. එවැනි නියෝගයක් ඇත්තේ නම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි හිමිකරු විසින් ඒ අනුව ක්‍රියා කිරීම කළ යුතු ය.

